# (ඉ) රජයේ මුදල් පරිහරණය

## (අ) කොටස – 1965/1966 මුදල් වර්ෂය

1965 ඔක්තෝබර් මාසයේ සිට 1966 සැප්තැම්බර් මාසය තෙක් වූ මුදල් වර්ෂය සඳහා රාජ්‍ය මුදල් පරිහරණය පිළිබඳ සංඛ්‍යා සහ පසුගිය වර්ෂ වල අනුරූප සංඛ්‍යා තොරතුරු II (ඉ) 1 සංඛ්‍යා සටහනේ පිඩු කොට දක්වේ. එහි දක්වා ඇති පරිදි, 1965/66 වර්ෂය සඳහා අය වැය ලේඛන ගනුදෙනු වල ප්‍රධාන ලක්ෂණ මෙසේ ය :—

(අ) රජයේ මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 1,833·2 ක් වූ අතර, 1964/65 දී රුපියල් දශ ලක්ෂ 1,816·4 ක් ද, 1963/64 දී රුපියල් දශ ලක්ෂ 1,759·0 ක් ද විය.

(ආ) සම්මත වූ මුළු වියදම[1] රුපියල් දශ ලක්ෂ 2,388·2 ක් විය. 1964/65 සම්මත මුළු වියදම රුපියල් දශ ලක්ෂ 2,274·6 ක් වූ අතර, 1963/64 දී එය රුපියල් දශ ලක්ෂ 2,236·6 ක් විය. මෙම මුළු වියදමින්, ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 1,860·5 කි. 1964/65 සහ 1963/64 යන වර්ෂවල ආවර්තන වියදම පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 1,803·4 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,834·1 ක් විය. ප්‍රාග්ධන වැය සම්මත සඳහාවූ වියදම රුපියල් දශ ලක්ෂ 527·7 ක් වූ අතර, එය 1964/65 දී රුපියල් දශ ලක්ෂ 471·2 ක් ද, 1963/64 දී රුපියල් දශ ලක්ෂ 402·5 ක් ද විය.

(ඇ) අත්තිකාරම් ගිණුමේ ගනුදෙනු නිසා රුපියල් දශ ලක්ෂ 11·2 ක් (ශුද්ධ) ගෙවීමට සිදු විය. එම ගිණුමේ ගනුදෙනු වලින් 1964/65 දී රුපියල් දශ ලක්ෂ 27·9 ක් (ශුද්ධ) හා 1963/64 දී රුපියල් දශ ලක්ෂ 16·1 ක් (ශුද්ධ) ලැබී ඇත.

(ඈ) මෙම ගනුදෙනු හේතු කොට ගෙන රජයට ඇති වූ ශුද්ධ අය වැය හිඟය රුපියල් දශ ලක්ෂ 565·9ක් විය. 1964/65 දී ඇති වූ හිඟය රුපියල් දශ ලක්ෂ 430·4 ක් වූ අතර, 1963/64 දී හිඟය රුපියල් දශ ලක්ෂ 461·7 ක් විය.

(ඉ) 1965/66 ශුද්ධ අය වැය හිඟය පියවීම සඳහා රජය දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් දශ ලක්ෂ 418·2 ක් ණයට ගත් අතර, වෙළෙඳ පොළෙන් බැහැර අනිකුත් දේශීය මාර්ග වලින් රුපියල් දශ ලක්ෂ 112·1 ක් ද, විදේශීය මාර්ග වලින් රුපියල් දශ ලක්ෂ 118·0 ක් ද ලබා ගන්නා ලදී. මින් කොටසක් (රුපියල් දශ ලක්ෂ 82·4) භාණ්ඩ ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ඇතුළු ශේෂයන් වැඩි කිරීමට යොදා ගන්නා ලදී.

(ඊ) එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වල ඇති වූ වෙනස්වීම් වෙනුවෙන් ගැලපූ විට, ශුද්ධ මුදල් හිඟය නිසා ඇති වූ ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 122·4 ක් විය. මෙය 1964/65 දී රුපියල් දශ ලක්ෂ 34·7 ක් වූ අතර, 1963/64 දී රුපියල් දශ ලක්ෂ 162·9 ක් විය.

### ආදායම

රජයේ ඇස්තමේන්තු වල දක්වෙන ප්‍රධාන අය ශීර්ෂයන් යටතේ, 1965/66 ඇස්තමේන්තු කළ ආදායම සහ නියම වශයෙන් එකතු වූ ආදායම ද (තාවකාලික) 1964/65 දී එකතු වූ නියම ආදායම ද 11 වැනි පිරිශිෂ්ටයේ, 19 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1965/66 නියම (තාව කාලික) ආදායම රුපියල් දශ ලක්ෂ 1,833·2 ක් විය. එම ආදායම 1964/65 (අනුරූප) සංඛ්‍යාවට

---

1. II (ඉ) 1 සංඛ්‍යා සටහනේ 1 (ආ) 1 සහ 1 (ආ) 11 ශීර්ෂ යටතේ වූ එකතුව.

(රුපියල් දශ ලක්ෂ 1,816·4) වඩා රුපියල් දශ ලක්ෂ 16·8 කින් හෙවත් සියයට 0·9 කින් වැඩිය.

1956/57 සිට 1965/66 දක්වා වූ දශකය තුළ රජයේ ආදායම සියයට 45·8 කින් හෙවත් වාර්ෂිකව සියයට 3·9 (සංයුක්ත) ගණනෝ වැඩි වී ඇත. පසුගිය මුදල් වර්ෂ පහ තුළ දී රජයේ ආදායම සියයට 21·1 කින් හෙවත් වාර්ෂිකව 4·0% (සංයුක්ත) ගණනෝ වැඩි වී ඇත. 1963/64 සහ 1964/65 යන වර්ෂ වල දී ආදායම සෑහෙන ලෙසකින් වැඩිවීම රජයේ මුදල් පරිහරණයේ සතුටු දයක ලක්ෂණයන් ලෙස 1964 සහ 1965 වාර්ෂික වාර්තා වල සඳහන් කිරීමට අවසථාව ලැබිණි. පසුගිය මුදල් වර්ෂය තුළ දී ආදායම නිරපේක්ෂ වශයෙන් ඉහළ ගිය නමුදු මීට පෙර මුදල් වර්ෂ වල දී ඉහළ ගිය ප්‍රමාණයට ම වැඩි නොවුණු බව පෙනී යයි.

තවද, වර්ෂය මැද ජනගහනය පිළිබඳ සංඛ්‍යා පදනම් කර ගෙන පිළියෙළ කරන ලද ඒක ජන ආදායම්, විශ්ලේෂණය කිරීමේ දී පෙනී ගිය, 1964/65 න් අවසන් වූ පස් වර්ෂය තුළ දී වැඩි වූ ඒකජන ආදායම, 1965/66 දී පහත වැටුනු බව පෙනී යයි. 1959/60 ඒකජන ආදායම රුපියල් 141·79 සිට 1964/65 දී රුපියල් 161·75 දක්වා වැඩි වූ අතර, 1965/66 දී රුපියල් 159·54 දක්වා පහත වැටිණි. සියයට 2·3 කින් ජනගහනය වැඩි වන බව තක්සේරු කර ඇති අවසථාවක දී ආදායමේ වැඩිවීම සියයට 0·9 ක් පමණක් වීම නිසා ඒකජන ආදායම් පහත වැටීම බලාපොරොත්තු විය යුතුය.

1965/66 සඳහා තක්සේරු ආදායම රුපියල් දශ ලක්ෂ 1,897·8 ක් වූ නමුදු එකතු වූ නියම ආදායම රුපියල් දශ ලක්ෂ 64·6 කින් අඩු විය. 1964/65, 1963/64 සහ 1962/63 සඳහා අනුරූප අධි තක්සේරුව පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 4·9, 28·6 සහ 123·5 ක් විය.

II (ඉ) 2 සංඛ්‍යා සටහනින් 1965/66 ප්‍රධාන ආදායම් ශීර්ෂ යටතේ ලැබුනු නියම ආදායම් වල (තාවකාලික) ඇති වූ වැදගත් වෙනස්වීම් සවිස්තරව දක්වා ඇති අතර, 1964/65 නියම ආදායම හා 1965/66 මුල් ඇස්තමේන්තු සමග සසඳා ඇත.

1965/66 මුදල් වර්ෂයේ ආනයන වලින් ලද ආදායම(1) කලින් මුදල් වර්ෂයේ දී ලද ආදායමට වඩා රුපියල් දශ ලක්ෂ 41·0 කින් වැඩි විය. කපු නූල් ආදියෙන් (රුපියල් දශ ලක්ෂ 6·7) මෝටර් ස්ප්‍රිත්තු සහ ද්‍රව ඉන්ධන වලින් (රුපියල් දශ ලක්ෂ 11·6) සහ " අනෙකුත් භාණ්ඩ වලින් " (රුපියල් දශ ලක්ෂ 36·8) වැඩි වූ ආදායම රුපියල් දශ ලක්ෂ 55·1 ක් විය. මෙම වැඩි වීම, දුම් කොළ සහ සිගරට් ආනයනයෙන් ලැබු බදු ආදායමත් (රුපියල් දශ ලක්ෂ 13·7) සීනි වලින් ලද ආදායමත් (රුපියල් දශ ලක්ෂ 3·4) අඩු වීම නිසා තරමක් දුරට මැකී ගියේ ය. කපු නූල්, නූල් කැරලි හා රෙදි කඩ්ච් ආදියෙන් ආදායම වැඩිවීමට හේතුව, මෙම භාණ්ඩ වැඩියෙන් ආනයනය කිරීම සහ රෙදිපිළි වලින් තීරු බදු අය කිරීමේ ක්‍රමය වෙනස් කිරීමය. මෝටර් ස්ප්‍රිත්තු සහ ද්‍රව ඉන්ධන වලින් ලැබූ වැඩි ආදායමට හේතු වූයේ ඝන තෙල් වලින් වැඩි තීරු බද්දක් අය කිරීමය. " අනෙකුත් භාණ්ඩ " වලින් ලැබූ තීරු බදු ආදායම වැඩි වූයේ ආනයනය කළ ප්‍රමාණය වැඩි වීම සහ සමහර භාණ්ඩ(2) සඳහා සියයට 10 ක අධි අය කිරීමක් පැනවීම නිසාය. දුම්කොළ සහ සිගරට් ආනයනය කළ ප්‍රමාණය අඩුවීම නිසා ඉන් ලැබූ ආදායම අඩුවී ඇති අතර, සීනි සඳහා වූ තීරු බදු වලින් අඩු ආදායමක් ලබා ඇත්තේ ආහාර කොමසාරිස් විසින් තීරු බදු ගෙවීම ප්‍රමාද කිරීම නිසාය.

(1) බලපත්‍ර යටතේ ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා වූ බලපත්‍ර ගාස්තු ඇතුළත් වෙයි.

(2) ආහාර භාණ්ඩ, බෙහෙත් ද්‍රව්‍ය, පොහොර, භූමිතෙල් ඇතුළු ඛණිජ තෙල් නිෂ්පාදිත, රෙදිපිළි, රථවාහන අමතර කොටස්, සිමෙන්ති, කෘෂිකාර්මික උපකරණ සහ යන්ත්‍ර සහ අපනයන කර්මාන්තවලට අවශ්‍ය භාණ්ඩ ආදිය හැර අනිකුත් භාණ්ඩ වලින් සියයට 10 ක අධි අයකිරීමක්, පවත්නා තීරු බදු මත පනවන ලදී.

## රජයේ අය - වැය

| | 1954/55 | 1955/66 | 1956/57 | 1957/58 | 1958/59 |
|---|---|---|---|---|---|
| 1. ශුද්ධ අයවැය අතිරික්තය/හිඟය ( — ) ... | 127·6 | – 1·2 | – 196·4 | – 222·3 | – 413·4 |
| අ. ආදායම ... | 1,158·6 | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 |
| ආ. වියදම (එනම්, ණය ගනුදෙනු වල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මූළු ගෙවීම) ... | –1,031·0 | –1,258·4 | –1,456·9 | –1,502·3 | –1,743·8 |
| (1) ආවර්තන වියදම් (අ) (ආ)* ... | – 864·9 | –1,014·4 | –1,105·2 | –1,280·1 | –1,432·2 |
| (2) ප්‍රාග්ධන වියදම් (අ)* ... | – 215·5 | – 211·0 | – 213·3 | – 282·6 | – 303·4 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම් ... | – 2·1 | – 4·0 | – 5·1 | – 3·0 | – 2·4 |
| (4) නිකුත් නොකළ ගබඩා තොග හා උප කරණ (ඇ) ... | 9·9 | 1·2 | – 14·5 | — | 10·5 |
| (5) රජයේ දෙපාර්තමේන්තුවලට අත්තිකාරම් (ඇ) ... (6) ලංකා-චීන වෙළෙඳ ගිණුම (ඇ) ... } | 34·0 | – 30·3 | – 115·8 | 54·5 | – 17·1 |
| (7) විවිධ (ඇ) ... | 7·6 | 0·1 | – 3·0 | 8·9 | 0·8 |
| හිඟය පියවීම | | | | | |
| 2. රාජ්‍ය ණය ගනුදෙනු වලින් උද්ගතවන (ශුද්ධ) ලැබීම් හා ගෙවීම් ( — ) සහ විදේශීය දීමනා ලැබීම් ... | – 39·0 | 12·2 | 175·4 | 174·7 | 351·8 |
| අ. වෙළෙඳ පොළෙන් නොවන දේශීය ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතු එව) ... | 29·1 | – 36·5 | – 9·4 | 72·5 | 27·6 |
| (1) පරිපාලන ණය ගැනීම් ... | — | — | — | — | — |
| (2) තැන්පතු (ඇ) ... | 34·5 | – 10·8 | 9·0 | 73·9 | 27·3 |
| (3) විවිධ අරමුදල් (ඉ) ... | 0·9 | – 4·8 | – 2·3 | 20·1 | 4·2 |
| (4) රජයේ ආයතන වලට හා රජයේ නිල ධාරීන්ට ණය (ඊ) ... | – 4·5 | – 20·9 | – 16·1 | – 21·5 | – 3·9 |
| ආ. දේශීය වෙළෙඳ පොළේ ණය ගැණුම් හා ණය ආපසු ගෙවීම් ... | – 76·7 | 47·0 | 169·7 | 81·9 | 294·6 |
| (1) රුපියල් ණය ... | 75·0 | 74·5 | 94·9 | 45·0 | 95·0 |
| නිදන් අරමුදල් දයක දීමනා හැර ... | 41·0 | 35·5 | 27·6 | 23·1 | 26·3 |
| | 34·0 | 39·0 | 67·3 | 21·9 | 68·7 |
| (2) භාණ්ඩාගාර බිල් ... | – 44·9 | 8·0 | – 3·0 | 74·6 | 179·0 |
| (3) මහ බැංකු අත්තිකාරම් ... | – 65·8 | — | 96·3 | – 13·8 | 41·1 |
| (4) බදු සංචිත සහතික ... | — | — | 9·1 | – 0·8 | 5·8 |
| ඇ. විදේශීය මුදල් ... | 8·6 | 1·7 | 15·1 | 20·3 | 29·6 |
| (1) ණය ... | 12·1 | 5·2 | 18·6 | 23·7 | 35·5 |
| නිදන් අරමුදල් දයක දීමනා හා ආදය මෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර ... | 3·5 | 3·5 | 3·5 | 3·4 | 5·9 |
| | 8·6 | 1·7 | 15·1 | 20·3 | 29·6 |
| (2) දීමනා ... | — | — | — | — | — |
| 3. මුදල් ශේෂ හා ද්‍රව්‍යාධාර අරමුදල් වෙනස්වීම | 88·6 | 11·0 | – 21·0 | – 47·5 | – 61·7 |
| (1) මුදල් ශේෂ (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව) ... | 88·6 | 11·0 | – 21·0 | – 47·5 | – 61·7 |
| (2) ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ... | — | — | — | — | — |

(අ) 2 වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ (උ) අධෝ ලිපිය බලන්න.
ගත වූ මුදල් වර්ෂ වල දී වැය වූ, ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදමට මාරු කිරීමෙන් උද්ගත වන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩු වේ ගිණුම් වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

(ආ) නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර ඇත. 2 (ආ) 1 සහ 2 (ඇ) 1 බලන්න.

(ඇ) මුදල් වර්ෂය අවසානයේ දී වූ වෙනස (ශුද්ධ) දක්වේ. ලංකා – චීන වෙළෙඳ ගිණුම පිළිබඳ විස්තර 1954/55 සිට 1960/61 දක්වා වූ වර්ෂ සඳහා වෙන වෙන ම ලබා ගැනීමට නොමැත.

(ඈ) නඩු කියන්නන්, කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් ; 1959/60 දක්වා වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර ඇතුළත් වේ.

(ඉ) වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල යනාදිය.

(ඊ) මෙම ණය කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනයට ප්‍රදේශීය ණය හා සංවර්ධන අරමුදලට, කාර්මික සමායතන වලට, හා රජයේ නිලධාරීනට දෙන ලදී.

**සංඛ්‍යා සටහන II (ඉ) 1**

**අතිරික්තය/හිඟය ( – )**

රුපියල් දශ ලක්ෂ

| 1959/60 | 1960/61(එ) | 1961/62 | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66(ඔ) |
|---|---|---|---|---|---|---|
| – 417·5 | – 462·5 | – 456·1 | – 391·7 | – 461·7 | – 430·4 | – 565·9 |
| 1,403·8 | 1,513·9 | 1,620·6(ඒ) | 1,593·4(ඒ) | 1,759·0(ඒ) | 1,816·4(ඒ) | 1,833·2(ඒ) |
| –1,821·3 | –1,976·4 | –2,076·6 | –1,985·3 | –2,220·7 | –2,246·8 | –2,399·4 |
| –1,511·9 | –1,540·8(ඌ) | –1,580·7(ඌ) | –1,596·4(ඌ) | –1,834·1(ඌ) | –1,803·4(ඌ) | –1,860·5(ඌ) |
| – 306·6 | – 419·9 | – 480·6 | – 402·3 | – 402·5 | – 471·2 | – 527·7 |
| – 1·5 | – 1·5 | – 0·7 | – 0·3 | – 0·2 | 0·1 | ... |
| – 7·1 | 1·9 | 2·4 | – 8·6 | – 5·2 | 2·7 | – 15·5 |
| 5·8 | – 15·9 | } 10·2 | 7·6 | – 45·9 | 97·9 | 11·3 |
| | | } – 26·0 | 20·3 | 61·0 | – 70·4 | – 6·6 |
| — | – 0·2 | – 1·2 | – 5·6 | 6·2 | – 2·3 | – 0·4 |
| 411·6 | 462·5 | 496·3 | 391·3 | 416·3 | 410·9 | 648·3 |
| 57·4 | 29·4 | 104·5 | – 33·8 | – 1·9 | 50·3 | 112·1 |
| 49·3 | – 2·9 | 11·9 | – 0·4 | – 17·2 | – 8·6 | 41·7 |
| 13·0 | 39·4 | 86·5 | – 27·6 | 17·4 | 68·2 | 76·5 |
| 2·7 | – 1·0 | 4·8 | 0·1 | 2·5 | – 3·1 | 0·2 |
| – 7·6 | – 6·1 | 1·3 | – 5·9 | – 4·6 | – 6·2 | – 6·3 |
| 330·5 | 409·4 | 338·9 | 333·1 | 322·8 | 260·9 | 418·2 |
| 134·8 | 214·9 | 145·0 | 205·0 | 245·0 | 253·1 | 325·0 |
| 27·7 | 29·2 | 35·0 | 38·9 | 44·6 | 51·2 | 58·9 |
| 107·1 | 185·7 | 110·0 | 166·1 | 200·4 | 201·9 | 266·1 |
| 228·2 | 198·4 | 248·0 | 124·1 | 128·4 | 50·5 | 124·3 |
| 3·1(ඌ) | 20·6(ඌ) | – 21·0(ඌ) | 36·6(ඌ) | – 19·4(ඌ) | 8·3(ඌ) | 28·3(ඌ) |
| – 7·9 | 4·7 | 1·9 | 6·3 | 13·4 | 0·2 | – 0·5 |
| 23·7 | 23·7 | 52·9 | 92·0 | 95·4 | 99·7 | 118·0 |
| 29·3 | 16·3 | 44·5 | 68·7 | 75·7 | 92·8 | 112·4 |
| 5·6 | 5·9 | 9·7 | 7·8 | 12·2 | 17·2 | 35·9 |
| 23·7 | 10·4 | 34·8 | 60·9 | 63·5 | 75·6 | 76·5 |
| — | 13·3 | 18·1 | 31·1 | 31·9 | 24·1 | 41·5 |
| – 6·0 | ... | 40·2 | – 0·4 | – 45·4 | – 19·5 | 82·4 |
| – 6·0 | ... | 40·2 | – 0·4 | – 45·4 | – 19·5 | 47·2 |
| — | — | — | — | — | — | 35·2 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(උ) 1954/55 ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට 1958/59 දී ආවර්තන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල, 1958/59 සංඛ්‍යාවන්ගෙන් ඉවත් කර තුබුන ද, (සංලක්ෂ්‍යය බලන්න)* 1954/55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත.

(ඌ) ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට ගෙවීමට තුබූ මුදල් බේරීම් වස් මහ බැංකුවෙන් ලබාගත් විශේෂ ණය වලින් 1959/60 දී රුපියල් කෝටි 3,7 ක් ද, 1960/61 දී රුපියල් කෝටි 0·22 ක්ද, 1961/62 දී, 1962/63 දී හා 1963/64 දී රුපියල් කෝටි 0·02 ක්ද, 1964/65 දී රුපියල් කෝටි 2,15 ක් ද, 1965/66 දී රුපියල් කෝටි 2·11 ක් ද යන වශයෙන් ගෙවන ලද මුදල් ඇතුළත් නොවේ.

(එ) 1960/61 සිට විදේශ දීමනා වලට අය වන ප්‍රාග්ධන වියදම් අය වැය ලේඛනයට ඇතුළත් කෙරිණ. 1960/61 ට පෙර, විදේශ දීමනාවලින් වියදම් නොකොට ඉතිරි වූ භාණ්ඩාගාරයේ අය වැය මුදල් මාර්ගයක් ව පැවැති, ශේෂ පමණක් තැන්පතු යටතේ ඇතුළත් කැරිණ.

(ඒ) 1965/66 ආදයම් සංඛ්‍යාව රජයේ ගිණුම්හි දක්වා ඇති ආදයම් සංඛ්‍යාවට වෙනස් වෙයි. ඊට හේතුව ආහාර කොමසාරිස් වරයාගේ රුපියල් කෝටි 2·68 ක පොත් බැරක් හා ආදයම් යටතේ වර්ග කැරුන රුපියල් කෝටි 1·81 ක විදේශීය දීමනා එයට ඇතුළත් නොවීම හා ජාතික සංවර්ධන බද්දේ හිඟ මුදල් වශයෙන් ලැබුනු රුපියල් කෝටි 0·05 ක් ඇතුළත් වීමත් ය.

2 වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ (අ) අධෝ ලිපිය බලන්න.

(ඔ) තාවකාලිකයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 2
## රජයේ ආදායම

රුපියල් දශ ලක්ෂ

| | 1965/66 මුල් ඇස්තමේන්තු | 1965/66 නියම (තාවකාලි කයි) | 1964/65 නියම | 1964/65 ට වඩා 1965/66 වෙනස (නියම) | 1965/66 මුල් ඇස්තමේන්තු හා සසඳන කල 65/66 (නියම) අධිකය + හෝ අඩුවීම (–) |
|---|---|---|---|---|---|
| 1. ආනයන බදු (අ) ... | 554·9 | 476·8 | 435·8 | 41·0 | —78·1 |
| (අ) කපු නූල් කැරලි හා රෙදි ... | 18·0 | 36·2 | 29·5 | 6·7 | +18·2 |
| (ආ) ධාන්‍යය හා පිටි ... | 22·7 | 19·2 | 19·8 | — 0·6 | — 3·5 |
| (ඇ) භූමිතෙල්, මෝටර් ස්ප්‍රිතු ආදිය ... | 128·0 | 127·0 | 115·4 | 11·6 | — 1·0 |
| (ඈ) දුම්කොළ හා සිගරැට් ... | 44·0 | 28·8 | 42·5 | —13·7 | —15·2 |
| (ඉ) සීනි ... | 28·6 | 19·9 | 23·3 | — 3·4 | — 8·7 |
| (ඊ) අනෙකුත් භාණ්ඩ * ... | 224·6 | 170·2 | 133·4 | 36·8 | —54·4 |
| 2. අපනයන බදු (ආ) මේවායින් ... | 292·7 | 255·8 | 312·8 | —57·0 | —36·9 |
| (අ) තේ (තේ බද්ද ඇතුළුව) ... | 225·8 | 202·4 | 228·8 | —26·4 | —23·4 |
| (ආ) රබර් ... | 20·1 | 17·0 | 22·4 | — 5·4 | — 3·1 |
| (ඇ) පොල් ... | 40·6 | 31·1 | 56·1 | —25·0 | — 9·5 |
| 3. ආදායම් බද්ද ... | 254·3 | 275·4 | 291·2 | —15·8 | +21·1 |
| 4. මුදල් බද්ද ... | 9·0 | 10·6 | 7·0 | 3·6 | + 1·6 |
| 5. පෞද්ගලික බද්ද ... | 19·2 | 12·0 | 18·9 | — 6·9 | — 7·2 |
| 6. අරක්කු විකිණීමෙන් ලාභ ... | 103·0 | 118·0 | 90·0 | 28·0 | +15·0 |
| 7. මෙරට නිෂ්පාදිත මද්‍යසාර සඳහා බද්ද | 12·0 | 14·4 | 11·5 | 2·9 | + 2·4 |
| 8. දුම්කොළ බද්ද ... | 108·0 | 120·0 | 110·0 | 10·0 | +12·0 |
| 9. ජාතික ලොතරැයිය ... | 5·5 | 9·5 | 5·3 | 4·2 | + 4·5 |
| 10. පිරිවැටුම් බද්ද ... | 34·0 | 39·1 | 34·8 | 4·3 | + 5·1 |
| 11. බැංකු හර බද්ද ... | 1·0 | 1·8 | 11·3 | — 9·5 | + 0·8 |
| 12. කලුතෙල් මෝටර් රථ බද්ද ... | 28·7 | 10·0 | 41·9 | —31·9 | —18·7 |
| 13. වෙළෙඳ ව්‍යාවසායයන්ගේ දළ ලැබීම් ... | 252·5 | 247·5 | 228·5 | 19·0 | — 5·0 |
| 14. අනෙකුත් ආදායම් ... | 223·0 | 242·3 | 217·1 | —25·2 | +64·6 |
| එකතුව ... | 1,897·8 | 1,833·2(ඇ) | 1,816·4(ඇ) | 16·8 | —64·6 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) බලපත්‍ර යටතේ කෙරෙන ආනයන සඳහා වූ බලපත්‍ර ගාස්තු ඇතුළත්ති.

(ආ) විවිධ බදු ඇතුළත්ති.

(ඇ) දෙවැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනෙහි (ආ) අධෝ ලිපියෙහි දක්වා ඇති හේතූන් නිසා ආදායම් සංඛ්‍යා රජයේ ගිණුම් වල දක්වා තිබෙන සංඛ්‍යා වලට වඩා වෙනස් වෙයි.

* 1965/66 හි ඇස්තමේන්තු වල රජයේ ආදායම් විග්‍රහයෙහි දක්වා ඇති ශීර්ෂයකි. (1 වැනි ශීර්ෂයේ (9) වැනි උප ශීර්ෂය.)

ආනයන ආදායම මෙන් නොව, අපනයන බදු වලින් ලැබූ ආදායම[1] 1964/65 දී ලැබූ ආදායම සමග සසඳා බලන විට, 1965/66 දී රුපියල් දශ ලක්ෂ 57·0ක් (සියයට 18) කින් පැහැදිළි වශයෙන් අඩුවී ඇත. ප්‍රධාන අපනයන භාණ්ඩ තුනෙන්ම ලැබූ තීරු බදු ආදායම පහළ බැස ඇති බව පෙනි යයි. තේ තීරු බද්දෙන් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 26·4 කින් ද, රබර් අපනයන තීරු බදු වලින් රුපියල් දශ ලක්ෂ 5·4 කින් ද පොල් නිෂ්පාදිත අපනයන තීරු බදු වලින් රුපියල් දශ ලක්ෂ 25·0 කින්ද, ආදායම අඩු වී තිබේ. තේ මිල පහත බැසීම හා අපනයන කළ ප්‍රමාණය අඩුවීම, තේ වලින් ලැබූ ආදායම අඩුවීමට හේතු වූ කරුණුය. 1965/66 දී අපනයනය කළ තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 3·5 කින් අඩු වූ අතර,[2] සියළුම තේ වර්ග වල සාමාන්‍ය නැ. වි. ස. මිල රාත්තලකට ශත 10 ක් තරමින් අඩු වී රාත්තල රුපියල් 2·37 ක් පමණ විය. 1965/66 දී තේ බද්ද (වටිනාකම අනුව) රුපියල් දශ ලක්ෂ 25·8 කින් පහළ බැස රුපියල් දශ ලක්ෂ 36·8 දක්වා අඩුවී තිබීම මේ සම්බන්ධයෙන් පෙනෙන විශේෂත්වයකි.

(1) කොළඹ සහ ලන්ඩන් වෙන්දේසි වල අය කරන තේ බද්ද ඇතුළත් වෙයි.

(2) 1965/66 දී අපනයන කළ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 47·45 කි.
1964/65 දී එය රාත්තල් කෝටි 47·8 කි.

තේ පිළිබඳව මෙන් නොව, රබර් අපනයනය කළ ප්‍රමාණය හා නැ. වි. ස. මිල ඉහළ නැඟ තිබිය දීත්, රබර් තීරු බදු වලින් ලැබූ ආදායම අඩු වී ඇත.(1) සැළකිල්ලට භාජනය වන මුදල් වර්ෂය තුළ දී අපනයනය කළ මුළු රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 24·8 කින් වැඩි වී රාත්තල් දශ ලක්ෂ 279·8 කට නැඟ තුබූ අතර, සියළු රබර් වර්ගවල නැ. වි. ස. මිල රාත්තලකට ශත 1 ක් බැගින් වැඩි වී රාත්තල රුපියල් 1·15 දක්වා ඉහළ නැඟ තිබිණ. ලන්ඩන් වෙළෙඳ පොළේ ආර්. එස්. එස්. නොම්මර 1 ෂීට් රබර් මිල අනුව, තීරු බදු තක්සේරු කර ඇතත්, චීන මහජන සමූහාණ්ඩුව සමග ඇති රබර් ගිවිසුම යටතේ ලැබෙන අධි මිල සතිපතා තීරු බදු තක්සේරු කිරී මේදී ඇතුළත් නොකිරීම මෙම පරස්පර විරෝධතාවයට හේතු වේ.(2)

තෙවැදෑරුම් පොල් නිෂ්පාදිතයන්ගෙන් එකතු වූ අපනයන තීරු බදු ආදායමේ අඩුවීම නිසා පොල් තීරු බද්දෙන් ලැබූ සම්පූර්ණ ආදායම[3] රුපියල් දශ ලක්ෂ 25·0 කින් අඩු විය. 1964/65 තීරු බදු ආදායම් සමග සසඳා බලන විට, පොල් තෙල් අපනයන වලින් ලැබූ තීරු බදු ආදායම රුපියල් දශ ලක්ෂ 14·5 කින් ද, කපාපු පොල් වලින් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 5·0 කින් ද, කොප්පරා ආදායම රුපියල් දශ ලක්ෂ 5·4 කින් ද අඩු වී ඇත. සියළුම පොල් නිෂ්පාදිතයන්ගෙන් ලැබූ තීරු බදු ආදායම අඩුවීමට හේතුව මිල පහත බැසීම(3) සහ අපනයනය කළ ප්‍රමාණය අඩුවීම යන කරුණු දෙකය. 1965/66 අපනයනය කළ පොල් තෙල් ප්‍රමාණය ටොන් 33,900(4) කින් අඩු වූ අතර, කපාපු පොල්(5) සහ කොප්පරා(6) ප්‍රමාණයන් පිළිවෙළින් ටොන් 3,900 කින් සහ 18,600 කින් අඩු විය. පොල් නිෂ්පාදිතයන්ගේ මිල උපනිති එතරම් සතුටුදායක නොවීය. තෙවැදෑරුම් පොල් නිෂ්පාදිතයන්ගේ සාමාන්‍ය නැ. වි. ස. මිල පසුගිය මුදල් වර්ෂ දෙකෙහි දීම ඉහළ ගිය බව දක්වෙන නමුදු, 1965/66 දී සියළුම පොල් නිෂ්පාදිතයන්ගේ සාමාන්‍ය මිල හොණ්ඩරයකට රුපියල් 1·15 බැගින් අඩු වී රුපියල් 71·43 කට බැස තිබිණ.

1964/65 ආදායම් බදු ලැබීම් සමග 1965/66 ලැබීම් සසඳන විට, එය රුපියල් දශ ලක්ෂ 15·8 කින් අඩුවී රුපියල් දශ ලක්ෂ 275·4 දක්වා පහත බැස තිබිණ. මේ අඩුවීමට හේතු කිහිපයකි.

(අ) සියළුම ආදායම් මට්ටම් වල බදු අනුපාතික අඩු කිරීම.

(ආ) ඉතුරු කිරීම් සහනය ; සහ

(ඇ) භාණ්ඩ මිල අඩුවීම.

පෞද්ගලික බදු වලින් ලැබුන ආදායම ද රුපියල් දශ ලක්ෂ 6·9 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 12·0 කට පහත බැස ඇත. සමාගම් සහ පුද්ගලයන්ට අදළ බදු අනුපාතිකවල අඩු කිරීමක් විය. එහෙත්, පිරිවැටුම් බද්දෙන් සහ මුදල් බද්දෙන් පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 4·3 ක සහ රුපියල් දශ ලක්ෂ 3·6 ක වැඩි ලැබීමක් තිබිණි.

---

(1) රබර් තීරු බදු අනුක්‍රම පරිමාණයක් මත පදනම් කර ඇත.

(2) 1965/66 දී චීන මහජන සමූහාණ්ඩුවට අපනයන කළ රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 20·8 කින් (රුපියල් දශ ලක්ෂ 34·5 කින්) වැඩි විය.

(3) පොල් නිෂ්පාදිතයන්ගෙන් අය කරන අපනයන තීරු බදු අනුක්‍රම පරිමාණයක් මත පදනම්ව ඇත.

(4) 1964/65 දී අපනයනය කළ පොල් තෙල් ප්‍රමාණය ටොන්, 1,03,800 වූ අතර, 1965/66 දී එය ටොන් 69,900 ක් ක් විය.

(5) 1964/65 දී අපනයනය කළ කපාපු පොල් ප්‍රමාණය ටොන්, 51,500 ක් වූ අතර, 1965/66 දී එය ටොන් 47,600 ක් විය.

(6) 1964/65 දී අපනයනය කළ කොප්පරා ප්‍රමාණය ටොන් 44,900 ක් වූ අතර, 1965/66 දී එය ටොන් 26,300 ක් විය.

1964/65 දී කළු තෙල් රථ බද්දෙන් සහ බැංකු හර බද්දෙන් ලැබූ ආදයම සමග 1965/66 සසඳන විට කළු තෙල් රථ බද්ද රුපියල් දශ ලක්ෂ 31·9 කින් ද, බැංකු හර බද්ද රුපියල් දශ ලක්ෂ 9·5 කින් ද අඩු වූ බව පෙනේ. මෙම බදු දෙකෙන් ලැබූ ආදයම අඩුවීමට හේතුව එම බදු ඉවත් කිරීමයි. කළු තෙල් රථ බද්ද 1966 ජනවාරි 1 වැනි ද ඉවත් කරන ලද අතර, බැංකු හර බද්ද 1965 ඔක්තෝබර් 1[(1)] වැනි දින අවලංගු කරන ලදී.

අපනයන තීරු බදු සහ ආදයම් බදු වලින් ද ලද ආදයම අඩුවූ නමුදු, අරක්කු වෙළෙඳාමෙන් ලද ලාභය, මෙරට සාදන ලද මත්පැන් වලින් ලැබූ දේශීය භාණ්ඩ බද්ද[(2)] සහ දුම්කොළ බද්ද වැඩි වෙමින් පැවතිණ. මෙම මාර්ග වලින් රජය ලැබූ ආදයම 1965/66 දී ඉතා වැදගත් විණි. අරක්කු විකිණීමෙන් ලද ලාභය රුපියල් දශ ලක්ෂ 28·0 කින් වැඩි වූ අතර දුම් කොළ බද්දෙන් ලැබූ ආදයම රුපියල් දශ ලක්ෂ 10·0 කින් වැඩි විය. පසුගිය වර්ෂ කිහිපය තුළ දුම්කොළ බද්ද හේතුකොටගෙන ආදයම සෑහෙන ලෙස වැඩිවීම, 1965 වාර්ෂික වාර්තාවෙහි සඳහන් කරන ලදී. 1960/61 සිට 1965/66 දක්වා පස් වර්ෂය තුළ දුම්කොළ බද්දෙන් ලද ආදායම අවුරුද්දට සියයට 21·4 (සංයුක්ත) බැගින් වැඩිවීම මේ සම්බන්ධයෙන් ඉතා වැදගත්ය.

1965/66 දී වැදගත් වෙනස්වීම් දක්වෙන අනිකුත් ආදයම් මාර්ග දෙක ජාතික ලොතරැයි ආදයම සහ වෙළෙඳ ව්‍යවසායයන්ගෙන් ලද දළ ආදයමය. ජාතික ලොතරැයියෙන් ලද ආදයම රුපියල් දශ ලක්ෂ 4·2කින් වැඩිවූ අතර, වෙළෙඳ ව්‍යාවසායයන්ගෙන්[(3)] ලත් දළ ආදයම රුපියල් දශ ලක්ෂ 19·0 කින් රුපියල් දශ ලක්ෂ 247·5 දක්වා වැඩිවිණි. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ විදුලිය සහ තැපැල් හා විදුලි සංඥ දෙපාර්තමේන්තු වල ආදයම පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 6·8 කින් සහ රුපියල් දශ ලක්ෂ 5·2 කින් වැඩිවීම වැදගත්ය.

**වියදම**

1956/57 සිට 1965/66 දක්වා වූ කාලය තුළ, ආවර්තන වැය සම්මත (වැය සම්මත 1, 2, 4 සහ 6) සහ ප්‍රාග්ධන වැය සම්මත (වැය සම්මත 3, 5, 7) වශයෙන් වර්ග කරන ලද රජයේ මුළු වියදම්[4] පහත දක්වෙන **II** (ඉ) 3 සංඛ්‍යා සටහනේ දක්වේ. අතිරේක අරමුදල් වලින් කැරෙන අය වැය වියදම්, රජයේ වර්තන වියදම්[5] සහ ප්‍රාග්ධන වියදම්[6] වෙනුවෙන් ගලපා දශ වාර්ෂික කාල ශ්‍රේණියක් වශයෙන් ද මෙම සංඛ්‍යා සටහනෙන් නිරූපනය කොට ඇත.

දනට ලබාගත හැකි තාවකාලික වැය සම්මත මුළු වියදම් සංඛ්‍යා අනුව බලන විට, 1965/66 දී රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 2,388·2 ක් විය. 1965/66 රජයේ මුළු සම්මත වියදම පසුගිය මුදල් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 113·6 කින් හෙවත්, සියයට 5·0 කින් වැඩි වූ අතර, 1964/65 දී රජයේ වියදමෙහි ඇති වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 38·0 ක් හෙවත්, සියයට 1·7 කි. එසේ වුවද, 1965/66 අවසන් වන දශකය තුළ දී ඇති වූ සියයට 6·9 ක් වූ (සංයුක්ත වෘධි අනුපාතිකයට වඩා මෙම වැඩිවීම අඩුය.

---

(1) රුපියල් දශ ලක්ෂ 1·8 ක් ආදයම් වශයෙන් එකතු කරන ලද නමුදු, 1965-9-30 වැනි දිනට පෙර ඒකාබද්ධ අරමුදලට බැර නොකරන ලදී.

(2) විදේශ මත්පැන් ද්‍රව්‍ය වැනි, එනම් ; බීර, ජින්, බ්‍රැන්ඩි, රම් ආදියෙන්

(3) දුම්රිය, විදුලි බල, තැපැල් සහ විදුලි සංඥ, ගුවන් විදුලි යන දෙපාර්තමේන්තු සහ වරාය කොමිසම ලද ආදයම ඇතුළුව.

(4) අත්තිකාරම් ගිණුම් ගනුදෙනු නිසා, සිදු වන ශුද්ධ ගෙවීම් (හෝ ලැබීම්) ඇතුළුවයි.

(5) ආවර්තන වැය සම්මත වල ඇතුලත් වන ප්‍රාග්ධන ශීර්ෂ අඩුකිරීමෙන් පසුවයි.

(6) අය වැය ලේඛනයට පිටස්තර ප්‍රාග්ධන වියදම, ආවර්තන වැය සම්මත වල ඇති ප්‍රාග්ධන ශීර්ෂ සහ ප්‍රාග්ධන වැය සම්මත යන සියල්ල ඇතුළුවයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 3

## රජයේ වියදම්

රුපියල් දශ ලක්ෂ

| | ආවර්තන වැය සම්මත වලට අයවන වියදම් | | | ප්‍රාග්ධන වැය සම්මත වලට අයවන වියදම් | | | වැය සම මත වලට ඇතුළත් මුළු වියදම | අධි අයවැය මය අර මුදල් වලින් පියවුන ප්‍රාග්ධන වියදම | මුළු ප්‍රාග් ධන විය දම (ඈ) | අත්තිකාරම් ගිණුම් සඳහා වූ ශුද්ධ ලැබීම් හෝ ගෙවීම් (ඉ) | මුළු වියදම (ඊ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්තන වියදම් (i) | ආවර්තන වැය සම්මත වල ප්‍රාග්ධන ශීර්ෂ (ii) | එකතුව (අ) (iii) = (i) + (ii) | මූර්ත වත් කම් අත්කර ගැනීම නිර්මාණය හා පවත්වා ගෙන යාම (ආ) (iv) | මූල්‍ය වත්කම් අත්කර ගැනීම (ආ) (v) | එකතුව (ඇ) (vi) = (iv) + (v) | (vii) = (iii) + (vi) | (viii) | (ii) + (ix) = (vii) + (viii) | (x) | (xi) = (vii) + (viii) + (x) |
| 1955/56 ... ... | 862·8 | 151·6 | 1,014·4 | 181·8 | 29·2 | 211·0 | 1,225·4 | 68·3 | 430·9 | 29·0 | 1,322·7 |
| 1956/57 ... ... | 976·7 | 128·5 | 1,105·2 | 198·2 | 15·1 | 213·3 | 1,318·5 | 54·1 | 395·9 | 133·3 | 1,506·0 |
| 1957/58 ... ... | 1,118·2 | 161·9 | 1,280·1 | 227·8 | 54·8 | 282·6 | 1,562·7 | 54·1 | 498·6 | —63·4 | 1,553·3 |
| 1958/59 ... ... | 1,274·4 | 157·8 | 1,432·2 | 257·5 | 45·9 | 303·4 | 1,735·6 | 31·8 | 493·0 | 5·8 | 1,773·2 |
| 1959/60 ... ... | 1,365·4 | 146·5 | 1,511·9 | 258·6 | 48·0 | 306·6 | 1,818·5 | 42·6 | 495·7 | 1·3 | 1,862·4 |
| 1960/61 ... ... | 1,471·3 | 69·5* | 1,540·8 | 378·8 | 41·1 | 419·9 | 1,960·7 | 29·7 | 519·1 | 14·2 | 2,004·7 |
| 1961/62 ... ... | 1,498·1 | 82·6 | 1,580·7 | 394·4 | 86·2 | 480·6 | 2,061·3 | 22·4 | 585·6 | 14·6 | 2,098·3 |
| 1962/63 ... ... | 1,534·0 | 62·4 | 1,596·4 | 398·3 | 4·0 | 402·3 | 1,998·7 | 24·3 | 489·0 | — 13·7 | 2,009·3 |
| 1963/64 ... ... | 1,753·6 | 80·5 | 1,834·1 | 378·0 | 24·5 | 402·5 | 2,236·6 | 34·6 | 517·6 | — 16·1 | 2,255·2 |
| 1964/65 ... ... | 1,731·9 | 71·5 | 1,803·4 | 444·3 | 26·9 | 471·2 | 2,274·6 | 37·5 | 580·2 | — 27·9 | 2,284·0 |
| 1965/66 මුල් ඇස්තමේන්තු ... | 1,762·8 | 64·0 | 1,826·8 | 546·0 | 32·1 | 578·1 | 2,404·9 | 25·9 | 668·0 | ලැ.නො. | 2,430·8 |
| 1965/66 නියම (තාවකාලික) ... | 1,792·0 | 68·5 | 1,860·5 | 493·4 | 34·3 | 527·7 | 2,388·2 | 36·2 | 632·4 | 11·2 | 2,435·6 |
| 1966/67 මුල් ඇස්තමේන්තු ... | 1,891·8 | 81·2 | 1,973·0 | 739·9 | 21·8 | 761·7 | 2,734·7 | 51·7 | 894·6 | ලැ.නො. | 2,786·5 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1960 – 61 සිට ආවර්තන වැය සම්මත වල ප්‍රාග්ධන ශීර්ෂයන්හි ප්‍රමාණය තියුණු ලෙස අඩු වූයේ රජයේ ගිණුම් හි කලින් ආවර්තන වැය සම්මත යටතේ වර්ග කැරුන ප්‍රාග්ධන ස්වරූපයෙන් යුත් ඇතැම් ශීර්ෂ, ප්‍රාග්ධන වැය සම්මත වලට පැවරීමේ හේතුවෙනි.

(අ) 2 (ඉ)1 සංඛ්‍යා සටහනෙහි 1 (ආ) 1ශීර්ෂය බලන්න.
(ආ) 2 (ඉ)1 සංඛ්‍යා සටහනෙහි 1 (ආ) 2 ශීර්ෂය බලන්න.
(ඇ) 2 වැනි පිරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනෙහි 20 වැනි ශීර්ෂය බලන්න.
(ඉ) 2 වැනි පිරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනෙහි 22 වැනි ශීර්ෂය බලන.
(ඊ) 2 වැනි පරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනෙහි 23 වැනි ශීර්ෂය බලන්න.
(උ) 2 වැනි පරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනෙහි 24 වැනි ශීර්ෂය බලන්න.

1965/66 දී ඇති වූ රුපියල් දශ ලක්ෂ 113·6 ක වැඩි වීම ආවර්තන සහ ප්‍රාග්ධන වියදම් වල ඇති වූ වැඩිවීම් වල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. 1965/66 දී ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 57·1 කින් වැඩි වූ අතර, ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 56·5 කින් ඉහළ නැඟ රුපියල් දශ ලක්ෂ 527·7 දක්වා වැඩි විණි. මුළු ප්‍රාග්ධන වියදම පසුගිය සෑම මුදල් වර්ෂයකටම වඩා ඉහළ ගොස් තිබේ. මෙම ඉහළ යෑම සමහර විට 1965/66 රජයේ මුදල් පරිහරණයේ දිස් වුනු ඉතා සතුටුදයක ලක්ෂණය විය හැකිය.

1965/66 සඳහා මුලින් ඇස්තමේන්තු කරන ලද වැය සම්මත මේ වර්ෂයෙහි නියම (තාව කාලික) වියදම සමග සසඳන විට, නියම වියදම රුපියල් දශ ලක්ෂ 16·7 කින් අඩු වී ඇති බව පෙනේ. මෙසේ අඩුවීමට හේතුව රුපියල් දශ ලක්ෂ 50·4 (සියයට 8·7) ක් වූ ප්‍රාග්ධන වැය ශීර්ෂයන්හි ඌන වියදමක් ඇති වීමය. මෙය රුපියල් දශ ලක්ෂ 33·7 (සියයට 1·8) කින් වැඩි වූ ආවර්තන වියදම නිසා තරමක් දුරට මැකී ගියේ ය. ප්‍රාග්ධන සම්මත සඳහා වෙන් කරන ලද මුදල් අඩුවෙන් වැය කිරීම, 1963/64 දී සියයට 22·0 ක් වූ අතර, 1964/65 දී එය සියයට 15·6 ක් විය. 1965/66 දී තව දුරටත් සියයට 8·7 දක්වා අඩුවීම වැදගත් ලක්ෂණයකි.

## වර්තන වියදම

II (ඉ) 3 සංඛ්‍යා සටහන අනුව, 1965/66 වර්තන වියදම (තාවකාලික සංඛ්‍යා) 1964/65 වර්තන වියදමට වඩා රුපියල් දශ ලක්ෂ 60·1 කින් හෙවත් සියයට 3·5 කින් ඉහළ ගොස් ඇත. මීට වෙනස්ව, පසුගිය මුදල් වර්ෂයේ වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 21·7 කින් පහළ බැස ඇත. 1965/66 වර්තන වියදම් වැඩි වුවද, සියයට ගණනක් වශයෙන් සලකා බලන විට, එය 1956/57 සිට 1965/66 දක්වා වූ දශකය තුළ පෙනෙන්නට තිබුණ වාර්ෂික වැඩිවීම් අනුපාතිකයට වඩා අඩුය.[1] මුදල් වර්ෂය 1964/65 සිට 1966/67 දක්වා, රජයේ වර්තන වියදම්, සවිස්තර ලෙස සසඳා, බැලීමේ පහසුව සඳහා II (ඉ) 4 සංඛ්‍යා සටහනෙහි ඇතුළත් කොට ඇත.

### සංඛ්‍යා සටහන II (ඉ) 4

### වර්තන වියදම 1964/65 සිට 1966/67

රුපියල් දශ ලක්ෂ

| | නියම 1964/65 | නියම (තාවකාලික) 1965/66 | මුල් ඇස්තමේන්තු 1965/66 | මුල් ඇස්තමේන්තු 1966/67 |
|---|---|---|---|---|
| 1. පරිපාලනය ... ... ... | 243·6 | 257·7 | 264·3 | 276·5 |
| 2. සමාජ සේවා—මෙවායින් ... ... ... | 491·5 | 500·6 | 502·5 | 522·6 |
| (අ) අධ්‍යාපනය ... ... ... | 329·0 | 331·6 | 334·5 | 347·4 |
| (ආ) සෞඛ්‍යය ... ... ... | 153·5 | 159·6 | 159·0 | 163·8 |
| 3. ආර්ථික සේවා ... ... ... | 124·4 | 122·1 | 124·8 | 144·5 |
| 4. රජයේ ව්‍යවසායයන් * ... ... | 246·9 | 259·2 | 256·4 | 258·2 |
| 5. පැවරීම් ගෙවුම්, මෙවායින් ... ... | 625·5 | 652·4 | 614·8 | 690·0 |
| (අ) ආහාර සහනාධාර ... ... ... | 290·0† | 290·0† | 271·5 | 307·3 |
| (ආ) රාජ්‍යය ණය පොළී ... ... | 105·9 | 123·1 | 114·9 | 139·7 |
| (ඇ) විශ්‍රාම වැටුප් ... ... ... | 143·3 | 141·4 | 145·9 | 156·4 |
| 6. මුළු වර්තන වියදම ... ... ... | 1,731·9 | 1,792·0 | 1,762·8 | 1,891·8 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* දුම්රිය විදුලි බලය, තැපැල් හා විදුලි සංදේශ හා ගුවන් විදුලි ප්‍රචාරක දෙපාර්තමේන්තුවල සහ වරාය කොමිසමේ වර්තන ගෙවුම් වලින් සමන්විත වෙයි.

† මේ සංඛ්‍යා භාණ්ඩාගාරයේ ලෙජර් වල දක්වෙන පරිදි වෙයි.

(1) වර්තන වියදම් වැඩිවීමේ වාර්ෂික අනුපාතිකය සියයට 7·6 ක් (සංයුක්ත) විය.

1964/65 සමග සසඳා බලන විට, 1965/66 දී සංක්‍රාම ගෙවුම් (රුපියල් දශ ලක්ෂ 26·9 කින්) පරිපාලන වියදම් (රුපියල් දශ ලක්ෂ 14·1 කින්) රජයේ ව්‍යවසායයන් සඳහා වියදම් (රුපියල් දශ ලක්ෂ 12·3 කින්) සහ සමාජ සේවා වියදම් (රුපියල් දශ ලක්ෂ 9·1 කින්) වැඩි වීම මෙම වර්ෂයේ වර්තන වියදම් ඉහළ යෑමට හේතු වී ඇති බව පෙනේ. ආර්ථික සේවාවන් සඳහා වැය වුනු වියදම රුපියල් දශ ලක්ෂ 2·3 කින් පහළ බැසීම නිසා යටකී වැඩිවීම තරමක් දුරට මැකී ගොස් ඇත.

සෞඛ්‍ය සහ අධ්‍යාපනික සේවාවන් සඳහා වැය වුනු වියදම ඉහළ යෑම සමාජ සේවා වියදම වැඩිවීමට හේතුවයි. සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා සඳහා වියදම ඉහළ යෑම ජනගහණය සහ පාසැල් වියේ ළමයින් වැඩි වන අවධියක බලාපොරොත්තු විය හැකිය. සංක්‍රාම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 26·9 කින් වැඩි වී ඇත්තේ, ප්‍රධාන වශයෙන් රාජ්‍ය ණය පොළී ගෙවීම් වැඩි වූ නිසාය. ආහාර සහනාධාර සම්මත සඳහා වියදම වෙනස් නොවී නැවතුණු අතර, විශ්‍රාම වැටුප් සඳහා වූ වියදම අඩු වී ඇත. රාජ්‍ය ණය පොළී ගෙවීම් වැඩිවීමට ප්‍රධාන හේතුව රුපියල් ණය පත් සහ භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළී ගෙවීම් ඉහළ යෑමය.

භාණ්ඩාගාරයේ ලෙජරයේ සංඛ්‍යා අනුව බලන විට, ආහාර සහනාධාර සම්මත යටතේ වියදම (රුපියල් දශ ලක්ෂ 290·0 ක්වූ) ස්ථාවරව පැවතුන ද, ආහාර කොමසාරිස් විසින් ආහාර ගනුදෙනු වියදම් සම්බන්ධයෙන් සපයන ලද තාවකාලික සංඛ්‍යා අනුව නම්, එය 1965/66[1] දී රුපියල් දශ ලක්ෂ 19·5 කින් වැඩි වී ඇති බව පෙනේ. II (ඉ) 5 සංඛ්‍යා සටහනේ 1964/65 සම්බන්ධයෙන් වූ ආහාර සහනාධාර සඳහා වැය වූ නියම වියදම ද, 1965/66 සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම සහ ආහාර ගනුදෙනු සඳහා නියම (තාවකාලික) වියදම ද, පෙන්නුම් කරයි. 1966/67 සඳහා සංඛ්‍යා සංසන්දනය කිරීමේ පහසුව සඳහා අයවැය ලේඛනයේ (මුල් ඇස්තමේන්තු) දැක්වෙන පරිදි ඉහත කී සටහනේ ඇතුළත් කර ඇත.

**සංඛ්‍යා සටහන II (ඉ) 5**

**1964/65 සිට 1966/67 දක්වා ආහාර සහනාධාර වියදම**

රුපියල් දශ ලක්ෂ

| | | 1964/65 | 1965/66 (මුල් ඇස්තමේන්තු) | 1965/66 (තාවකාලිකයි) | 1966/67 (මුල් ඇස්තමේන්තු) |
|---|---|---|---|---|---|
| 1. | ආනයන කළ සහල් වෙනුවෙන් පාරිභෝගිකයාට ආධාර ... | 162·8 | 186·6 | 175·6 | 163·2 |
| 2. | මෙරට නිපැදවූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට ආධාර ... | 261·1 | 258·1 | 271·2 | 333·0 |
| 3. | මෙරට නිෂ්පාදිත රතු ලූනු සඳහා ආධාර ... | 4·6 | 1·5 | 4·5 | 4·5 |
| 4. | බෙදු හැරීමේ වියදම් හා අනෙකුත් ගාස්තු ... | 27·6 | 32·2 | 39·4 | 33·0 |
| 5. | දළ ආධාර එකතුව (1 සිට 4) ... | 456·1 | 478·4 | 496·8 | 533·7 |
| 6. | සීනි විකිණීමෙන් ලාභ ... | 169·9 | 195·3 | 202·3 | 199·9 |
| 7. | පිටි විකිණීමෙන් ලාභ ... | 1·1 | 2·1 | —3·1 | 20·7 |
| 8. | අනෙකුත් භාණ්ඩ විකිණීමෙන් ලාභ ... | 13·9 | 9·6 | 1·6 | 5·9 |
| 9. | එකතුව (6 සිට 8) ... | 185·0 | 207·0 | 200·8 | 226·5 |
| 10. | ආහාර ආධාර (ශුද්ධ) (5 – 9) ... | 271·1 | 271·5 | 290·0 | 307·3(2) |

සංඛ්‍යා : ආහාර කොමසාරිස් වරයාගෙනි.

ආනයනය කළ සහල් වෙනුවෙන් පාරිභෝගිකයාට සහනාධාර (රුපියල් දශ ලක්ෂ 12·8 කින්) ඉහළ යෑමට ප්‍රධාන හේතුව කාම්බෝජය. තායිලන්තය සහ බුරුමයෙන් ගෙන් වන ලද සහල් සඳහා ගෙවිබාන විට වූ මිල ඉහළ නැගීමය. 1964/65 ට වඩා 1965/66 දී මිලට ගත් සහල් ප්‍රමාණය ද ටොන් 4,312 කින් වැඩි විය. මෙරට නිපද වූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට සහ

(1) මෙම වෙනසට හේතුව ගණන් තැබීමේ ක්‍රම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සහ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව අතර වෙනස්කම් තිබීමයි. II (ඉ) 4 සහ II (ඉ) 5 සංඛ්‍යා සටහන් දෙකෙහි ශුද්ධ සහනාධාර සංඛ්‍යා අතර වෙනස්කම් වලට හේතුව ද මෙයයි.

(2) පසුව, සහනාධාර පිට නිකුත් කැරුන සහල් සේරු දෙක වෙනුවට 1966 දෙසැම්බර් 18 වැනි දින සිට සලාක පොතකට නොමිලේ සහල් සේරුව බැගින් දීමට රජය විසින් තීරණය කැරුණි. මේ හේතුවෙන් පාරිභෝගිකයිනට නිකුත් කරනු ලබන සහල් ප්‍රමාණය වෙනස් විය හැකි අතර, සහල් සහනාධාරයෙන් සැලකිය යුතු ඉතුරුවක් ද බලාපොරොත්තු වනු ලැබේ. එසේම සහල් නිකුතුව අඩුවීමෙන් පිටි පාරිභෝජනය වැඩි වෙතැයි ද, ඒ හේතුවෙන් පිටි විකිණීමෙන් ලැබෙන ලාභය වැඩි වෙතැයි ද බලාපොරොත්තු වනු ලැබේ.

පාරිභෝගිකයාට ආධාර වැඩිවීමට (රුපියල් දශ ලක්ෂ 9·9) හේතුව, ගොවිජන සේවා කොම සාරිස් ගෙන් මිලට ගෙන පසුව පාරිභෝගිකයාට විකුණන ලද සහල් ප්‍රමාණය ටොන් 26,399 කින් ඉහළ යෑමය. 1964/65 ට වඩා 1965/66 දී විකුණන ලද මෙරට නිපද වූ සහල් ප්‍රමාණය ද ටොන් 42,769 කින් වැඩිය. බෙද හැරීමේ වියදම් සහ අනෙකුත් වියදම් ද රුපියල් දශ ලක්ෂ 11·8 කින් වැඩි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1965/66 දී දළ සහනාධාරය, පසුගිය මුදල් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 40·7 කින් වැඩි විය. එහෙදිත්, ශුද්ධ සහනාධාරය ඉහළ ගොස් ඇත්තේ රුපියල් දශ ලක්ෂ 18·9 කින් පමණය. මෙයට හේතුව, සීනි වෙළෙඳාමෙන් ලද ලාභය (රුපියල් දශ ලක්ෂ 32·4 කින්) සෑහෙන ලෙස ඉහළ නැගීමය. 1964/65 දී පැවැති මිල මට්ටම සමග සංසන්දනය කරන විට 1965/66 දී ගොඩබාන විට වූ සීනි මිල වේගයෙන් බැස තිබෙන බව පෙනේ. පාරිභෝගිකයාට සීනි විකුණු මිල, වර්ෂ දෙක තුළ දී ස්ථාවරව පැවතීම සහ සීනි මිල වේගයෙන් පහළ බැසීම, සීනි වෙළෙඳාමෙන් සෑහෙන ලාභයක් ලැබීමට උපකාරී වී තිබේ. ගොඩබාන විට වූ සාමාන්‍ය සීනි මිල (මිල සහ වාහන ගාස්තු ඇතුළුව) ටොන් එක රුපියල් 490 - ක් දක්වා ටොන් එකකට රුපියල් 111·00 කින් පමණ 1965/66 දී පහළ බැස ඇත.

### ප්‍රාග්ධන වියදම

II (ඉ) 3 සටහනේ දක්වා ඇති පරිදි 1965/66 නියම (තාවකාලික) ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 632·4 ක් විය. ආණ්ඩුවේ ගිණුම් වල, 3, 5, 7 යන සම්මත යටතේ දරන වියදම ද, 1, 2, 4 සහ 6 යන සම්මත වලට ඇතුළු ප්‍රාග්ධන වියදම් ලෙස සැලකිය හැකි වියදම් ද තේ සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල් වැනි අතිරේක අරමුදල් වලින් කැරෙන අය වැය වියදම් ද මෙම සම්පූර්ණ වියදමට ඇතුළත්ය. මෙසේ විග්‍රහ කර ඇති සම්පූර්ණ ප්‍රාග්ධන වියදම, 1964/65 අනුරූප සංඛ්‍යාව සමග සසඳන විට, රුපියල් දශ ලක්ෂ 52·2 කින් වැඩි වී ඇත. ප්‍රාග්ධන වියදම මෙසේ වැඩිවී ඇත්තේ ප්‍රධාන වශයෙන් මූර්ත වත්කම් ලබා ගැනීම, ගොඩනැගීම සහ පවත්වා ගැනීම (රුපියල් දශ ලක්ෂ 44·7) සඳහාය. 1965/66 දී අත්කරගත් මූල්‍ය වත්කම් වල වටිනාකම 1964/65 ට වඩා රුපියල් දශ ලක්ෂ 7·5 කින් වැඩි විය.

වැඩිදුරටත් සලකා බලන විට[1] වැඩි වූ ප්‍රාග්ධන වියදම් සම්පූර්ණයෙන් ම පාහේ වැය වී ඇත්තේ ආර්ථික සේවාවන් (රුපියල් දශ ලක්ෂ 57·1 ක්) සඳහා බව පෙනී යයි. ආර්ථික සේවා වන් අතුරෙන් කෘෂිකර්මය හා වාරිමාර්ග සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 30·0 කින් ද ධීවර කර්මාන්තය සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 27·5 කින් ද ගමනා ගමනය සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 20·2 කින් ද වැඩි වී ඇත. ආර්ථික සේවාවන් මෙන් නොව සමාජ සේවා වියදම රුපියල් දශ ලක්ෂ 19·3 කින් අඩු වී ඇත. නිවාස සහ අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම අඩුවීම මෙයට හේතුවයි.

### අත්තිකාරම් ගිණුම් ගනුදෙනු

1965/66 දී අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින් රුපියල් දශ ලක්ෂ 11·2 ක ශුද්ධ ගෙවීමක් කිරීමට සිදුවූ අතර, 1964/65 දී මෙම ගනුදෙනු වලින් රුපියල් දශ ලක්ෂ 27·9 ශුද්ධ ලැබීමක් ඇතිවිය, දනට ලබාගත හැකි සංඛ්‍යා තොරතුරු අනුව මෙකී ගිණුම් පිළිබඳ විස්තර සැපයිය නොහැකිය. ඉහත දක්වූ ශුද්ධ ගෙවීමට ප්‍රධාන හේතුව රජයේ ගබඩා දෙපාර්තමේන්තුව තොග වැඩිකර ගැනීමත් චීනය සමග ඇති රබර්/සහල් ගිවිසුම යටතේ ලංකාවට ලැබිය යුතු ශේෂය වැඩිවීමත්ය. රජයේ දෙපාර්තමේන්තු වලට අත්තිකාරම් වශයෙන් දුන් මුදල් ආපසු ලැබීම නිසා ශුද්ධ ගෙවීම තරමක් දුරට මැකී ගොස් ඇත.

---

(1) දෙවෙනි පරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනේ දී ඇති විස්තර පරිදි.

**ශුද්ධ අය වැය හිඟය**

1965/66 දී ශුද්ධ අය වැය හිඟය රුපියල් දශ ලක්ෂ 565·9 ක් විය. මෙය මෙතෙක් වාර්තාවී ඇති වැඩිම ශුද්ධ අය වැය හිඟය ය. පසුගිය මුදල් වර්ෂයේ හිඟය සමග සසඳා බලන විට ශුද්ධ අය වැය හිඟය රුපියල් දශ ලක්ෂ 135·5 (හෙවත් සියයට 31) කින් වැඩිය. මෙයට හේතු වූයේ ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 57·1 කින් ද, ප්‍රාග්ධන සම්මත වලට අයත් වියදම් රුපියල් දශ ලක්ෂ 56·5 කින් ද අත්තිකාරම් ගිණුමේ ගනුදෙනු වල ගෙවීම් රුපියල් දශ ලක්ෂ 39·1 කින් ද වැඩි වීමය. ආදයම් රුපියල් දශ ලක්ෂ 16·8 කින් වැඩි වීම නිසා ශුද්ධ අය වැය හිඟය තරමක් දුරටඅඩු වී ඇත.

1965/66 නියම (තාවකාලික) ශුද්ධ අය වැය හිඟය ද මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් දශ ලක්ෂ 104·5 කින් වැඩිය. මෙය පසුගිය වසරේ ඇති වූ හැඩ ගැස්මට වඩා වෙනස් වූවකි. පසුගිය මුදල් වර්ෂයේ දී නියම ශුද්ධ අය වැය හිඟය මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් දශ ලක්ෂ 70·4 කින් අඩු විය. 1965/66 නියම ශුද්ධ අය වැය හිඟය මුල් ඇස්තමේන්තුවට වඩා වැඩි වූයේ ආදයම රුපියල් දශ ලක්ෂ 64·6 කින් අඩුවීම සහ වියදම්[1] රුපියල් දශ ලක්ෂ 40·2 කින් වැඩිවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලය නිසාය. වියදම වැඩිවූයේ ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 79·4 කින්[2] වැඩිවීමත් අත්තිකාරම් ගිණුමේ ගනුදෙනු වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 11·2 (ශුද්ධ) ගෙවීමත් නිසාය. ප්‍රාග්ධන වියදම් මූලික ඇස්තමේන්තුවට වඩා රුපියල් දශ ලක්ෂ 50·4 කින් අඩු වීම නිසා මේ වැඩිවීම තරමක් දුරට මැකී ගොස් ඇත.

**හිඟය පියවීම**

ශුද්ධ අය වැය හිඟය පියැවුනු ආකාරය හා එහි ප්‍රාසාරණාත්මක බලපෑම් ඉකුත් මුදල් වර්ෂයේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ.

**සංඛ්‍යා සටහන II (ඉ) 6**

**හිඟය පියවූ ආකාරය**

රුපියල් දශ ලක්ෂ

| | 1964/65 | | | 1965/66 (තාවකාලිකයි) | | |
|---|---|---|---|---|---|---|
| 1. විදේශ මුදල් | | | | | | |
| (අ ) ණයට ගත් | | | | | | |
| (i) ණයට ගත් ප්‍රමාණය (දළ) ... | 92·8 | | | 112·4 | | |
| (ii) නැවත ගෙවීම් හා නිදන් අරමුදල් දයක දීමනා හැර ... | 17·2 | 75·6 | | 35·9 | 76·5 | |
| (ආ) දීමනා ... | | 24·1 | 99·7 | | 41·5 | 118·0 |
| 2. දේශීය වෙළෙඳ පොළෙන් නොවන ණය ගැනීම් ... | | | 50·3 | | | 112·1 |
| 3. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය ... | | | 17·7 | | | 162·3 |
| 4. බැංකු නොවන දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය ... | | | | | | |
| (අ ) ණයට ගත් ප්‍රමාණය (දළ) ... | | 294·4 | | | 314·8 | |
| (ආ) නිදන් අරමුදල් දයක දීමනා හැර ... | | 51·2 | 243·2 | | 58·9 | 255·9 |
| 5. රජයේ මුදල් ශේෂ හා ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම | | | | | | |
| (අ ) මුදල් ශේෂ ... | | 19·5 | | | — 47·2* | |
| (ආ) ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ... | | — | 19·5 | | — 35·2* | –82·4* |
| 6. ශුද්ධ අය වැය හිඟය ... | | | 430·4 | | | 565·9 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම ... | | | —2·5* | | | 42·5 |
| 8. රජයේ මුදල් ගණුදෙනුවල ප්‍රාසාරණාත්මක බලපෑම (3+5+7) ... | | | 34·7 | | | 122·4 |

* රින ලකුණ වැඩිවීමෙක් දක්වයි.

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1). අත්තිකාරම් ගිණුම් ගනුදෙනු සඳහා වියදම් වූ ශුද්ධ වියදම ඇතුළුව.

(2) ආවර්තන වියදම් සම්මත වල මුල් ඇස්තමේන්තු වලින් සියයට 2½ ක අඩු වියදමකට ඉඩ තැබීමෙන් පසුවය.

1965/66 වර්ෂයේ මුදල් ගනුදෙනු හේතුකොට ගෙන ඇති වූ රුපියල් දශ ලක්ෂ 565·9 ශුද්ධ අය වැය හිඟය, බැංකු නොවන දේශීය මාර්ග වලින් රුපියල් දශ ලක්ෂ 255·9 ක් ද බැංකු ක්‍රම යෙන් රුපියල් දශ ලක්ෂ 162·3 ක්ද, විදේශ ආධාර වලින් රුපියල් දශ ලක්ෂ 118·0 ක්ද, වෙළෙඳ නොවන දේශීය මාර්ග වලින් රුපියල් දශ ලක්ෂ 112·1 ක්ද ලබා ගෙන පියවන ලදී. මුදල් ශේෂ (ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ඇතුළුව) රුපියල් දශ ලක්ෂ 82·4 කින් වැඩි විණි.

ඉහත සඳහන් හේතූන් නිසා, 1965/66 ශුද්ධ අය වැය හිඟය කලින් මුදල් වර්ෂය හා සසඳන කල, රුපියල් දශ ලක්ෂ 135·5 කින් වැඩි වී ඇත. රජයේ මුදල් ගනුදෙනු වල ප්‍රාසාරණාත්මක බලපෑම[1] (රුපියල් දශ ලක්ෂ 87·1 ක්) ශුද්ධ අය වැය හිඟයේ වැඩිවීම තරම් නුවූවද, එය සෑහෙන ප්‍රමාණයක් විය. ශුද්ධ අය වැය හිඟයේ ප්‍රාසාරණාත්මක බලපෑම ශුද්ධ අය වැය හිඟයේ අනු පාතිකයක් වශයෙන් තව දුරටත් බලන කල එය 1964/65 සියයට 8·1 ක් වූ අතර 1965/66 සියයට 21·6 දක්වා වැඩි විය. මේ වැඩිවීමට බොහෝ දුරට බලපෑවේ බැංකු ක්‍රමයෙන් ණය ලබා ගැනීමය. ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සහ මුදල් ශේෂයන්හි වැඩි වීම නිසා අනුපාතිකයෙහි වැඩි වීම තරමක් දුරට අඩු වී ඇත.

1965/66 දී බැංකු ක්‍රමයෙන් ලබාගන්නා ලද රුපියල් දශ ලක්ෂ 162·3 සම්පූර්ණයෙන් ම ගනු ලැබුයේ මහ බැංකුවෙන්ය. මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 179·7 කින් වැඩි විය. මෙම වැඩි වූ ප්‍රමාණය ලබා ගනු ලැබුයේ රුපියල් දශ ලක්ෂ 151·4 ක භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් සහ රජයට මහ බැංකුවෙන් දෙන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 28·3 කින් වැඩි කර ගැනීමෙනි. අනෙක් අතට පසුගිය වර්ෂයේ මෙන් නොව, වෙළෙඳ බැංකු වලින් ගත් ණය 1965/66 දී ශුද්ධ අඩුවීමක් දක්වයි. වෙළෙඳ බැංකු වලින් ලබාගත් ණය ප්‍රමා ණය අඩුවූයේ (රුපියල් දශ ලක්ෂ 17·4) වෙළෙඳ බැංකු ලබාගත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ 15·9) සහ රජයේ සුරැකුම් පත් ලබාගත් ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ 1·6) අඩුවීම නිසාය. මේ කරුණු දෙකෙහි සම්බන්ධිත ප්‍රතිඵලය බදු සංචිත සහතික රුපියල් දශ ලක්ෂ 0·1 කින් වැඩිවීම නිසා තරමක් දුරට අඩු වී ඇත.

1965/66 දී බැංකු නොවන මාර්ග වලින් ගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 255·9 ක් වූයේ, 1964/65 එකී මාර්ග වලින් ගත් ප්‍රමාණයට (රුපියල් දශ ලක්ෂ 243·2) වඩා වැඩිවිය. 1959/60 සිට 1964/65 තෙක් වූ පස් අවුරුදු කාලය තුළ මෙරට බැංකු නොවන දේශීය මාර්ග වලින් ලැබුණ ණය සාමාන්‍යයෙන් වාර්ෂිකව රුපියල් දශ ලක්ෂ 31·3 කින් වැඩි වී ඇත. මෙම අංශය අය වැය හිඟය පියවීම සඳහා දායක වූ ප්‍රමාණය නිරපේක්ෂ වශයෙන් බලන කල, 1965/66 දී වැඩි වී ඇති නමුදු, පසුගිය මුදල් වර්ෂ පහ තුළ ඇති වූ සාමාන්‍ය වාර්ෂික වැඩිවීම හා සමාන නොවන බව පෙන්නුම් කරයි.

රක්ෂණ සංස්ථාව, සේවක අර්ථසාධක අරමුදල හැර අනිකුත් අර්ථසාධක අරමුදල්, සමිති සමාගම් සහ පුද්ගලයින් සිය දායක දීමනා වැඩි කිරීමෙන් 1965/66 දී වැඩි වූ මුළු ප්‍රමාණයෙහි ඇතුළත් ඔවුන්ගේ කොටස වැඩි කර ගන්නා ලදී. 1965/66 දී ප්‍රධාන ආයෝජන ගණයන් විසින් රජයේ සුරැකුම් පත් වලට (භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික ඇතුළුව) කැරුන දායක දීමනා, ඉකුත් මුදල් වර්ෂ තුනේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 7 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

---

(3) එක්සත් ජනපදයේ විදේශ ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වල වෙනස්වීම් වලට සැකසීමෙන් පසු

## සංඛ්‍යා සටහන II (ඉ) 7

### බැංකු නොවන ප්‍රධාන ආයෝජන ගණ විසින් රජයේ සුරකුම් පත් වෙනුවෙන් කැරුන දයක දීමනා

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66 | 1965/66 ට වඩා 1964/65 වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඉතිරි කිරීම් ආයතන ... | 14·3 | 28·9 | 37·9 | 37·0 | – 0·9 |
| 2. සේවක අර්ථසාධක අරමුදල ... | 61·7 | 65·6 | 70·0 | 74·7 | 4·7 |
| 3. රක්ෂණ සංස්ථාව ... | 16·4 | 29·0 | 42·2 | 46·2 | 4·0 |
| 4. අනෙකුත් රජයේ සමායතන ... | — | 3·5 | — | — | — |
| 5. දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලීය අරමුදල් | 6·5 | 9·6 | 13·8 | 2·0 | –11·8 |
| 6. අනෙකුත් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් | 31·2 | 22·0 | 28·4 | 41·1 | 12·7 |
| 7. අනෙකුත් රක්ෂණ අරමුදල් ... | 6·0 | 7·6 | 3·4 | 10·3 | 6·9 |
| 8. සමාගම්, සමාජ හා ආයතන ... | 5·1 | 12·3 | –2·1 | 6·1 | 8·2 |
| 9. පුද්ගලයින් ... | 0·1 | 1·2 | 2·7 | 15·2 | 12·5 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

## විදේශීය මුදල්

1965/66 දී ප්‍රාග්ධන වියදම සඳහා ලැබුන විදේශීය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 153·9ක් විය. මේ සම්බන්ධයෙන් 1964/65 දී රුපියල් දශ ලක්ෂ 116·9 ක්ද, 1963/64 දී රුපියල් දශ ලක්ෂ 107·6 ක්ද ලැබිණි. මෙම තුන් වසර තුළ දී රන් පවුම් ණය නිදන් අරමුදලට දයක දීමනා සහ අනෙකුත් විදේශීය ණය ආපසු ගෙවීම්, 1965/66 දී රුපියල් දශ ලක්ෂ 35·9 ක් ද, 1964/65 රුපියල් දශ ලක්ෂ 17·2 ක් ද, 1963/64 දී රුපියල් දශ ලක්ෂ 12·2 ක් ද විය.

විදේශාධාර, වර්ගය හා ලැබුන මාර්ගය අනුව වර්ග කොට II (ඉ) 8 සංඛ්‍යා සටහනෙහි සවිස්තරව දක්වා ඇත. 1965/66 මුදල් වර්ෂයේ දී, විදේශීය ණය හා දීමනා වලින් ලත් ශුද්ධ ලැබීම් රුපියල් දශ ලක්ෂ 18·3 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව පෙන්නුම් කරයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 8

### ප්‍රාග්ධන වියදම සඳහා විදේශ ආධාර ලැබීම්

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 ශුද්ධ ලැබීම් | 1962/63 ශුද්ධ ලැබීම් | 1963/64 ශුද්ධ ලැබීම් | 1964/65 ශුද්ධ ලැබීම් | 1965/66 ලැබුණ ප්‍රමාණය | 1965/66 ආපසු ගෙවූ ප්‍රමාණය | 1965/66 ශුද්ධ ලැබීම් |
|---|---|---|---|---|---|---|---|
| **ණය** | | | | | | | |
| 1. ජා. ප්‍ර. ස. බැංකුව ... | 25·6 | 21·2 | 11·3 | 5·0 | 5·3 | 6·5 | – 1·2 |
| 2. කැනඩාව ... | –1·3 | 0·8 | –0·2 | 11·4 | 7·6 | 5·1 | 2·5 |
| 3. චීනය ... | –1·0 | — | 12·4 | 18·9 | 13·8 | 4·0 | 9·7 |
| 4. එ. රාජධානිය ... | 0·4 | 10·4 | 4·9 | –2·3 | 23·7 | 13·0 | 10·6 |
| 5. එක්සත් ජනපද රාජ්‍යය ... | 7·6 | –0·7 | 2·7 | –1·2 | 25·1 | 1·3 | 23·8 |
| 6. සෝ. ස. ස. සංගමය ... | 3·4 | 13·5 | 32·0 | 28·8 | 9·4 | 0·2 | 9·3 |
| 7. බටහිර ජර්මනිය ... | — | 11·5 | 0·4 | 7·4 | 11·0 | 4·3 | 6·7 |
| 8. යුගෝස්ලේවියාව ... | — | 4·3 | ... | –0·3 | 1·7 | 0·9 | 0·8 |
| 9. පෝලන්තය ... | — | — | — | 2·4 | 0·7 | 0·5 | 0·1 |
| 10. ප්‍රංශය ... | — | — | — | 5·5 | 1·6 | — | 1·6 |
| 11. ජපානය ... | — | — | — | — | 10·0 | — | 10·0 |
| 12. ඉන්දියාව ... | — | — | — | — | 2·6 | — | 2·6 |
| **දීමනා** | | | | | | | |
| කොළඹ ක්‍රමය ... | | | | | | | |
| 1. ඕස්ට්‍රේලියාව ... | — | 2·5 | — | 3·9 | 0·3 | | 0·3 |
| 2. කැනඩාව ... | 4·4 | 5·7 | 5·7 | 5·1 | 25·6 | | 25·6 |
| 3. ජපානය ... | — | — | 0·3 | — | — | | — |
| **අනෙකුත්** | | | | | | | |
| 1. චීනය ... | 8·3 | 19·7 | 24·5 | 15·1 | 2·5 | | 2·5 |
| 2. එක්සත් ජනපද රාජ්‍යය ... | 1·6 | 0·9 | 1·4 | ... | 12·1 | | 12·1 |
| 3. බටහිර ජර්මනිය ... | 3·8 | 2·3 | — | — | — | | — |
| 4. එක්සත් ජාතීන් ... | — | — | — | — | 1·0 | | 1·0 |
| **ණය හා දීමනා එකතුව** ... | 52·9 | 92·0 | 95·4 | 99·7 | 153·9 | 35·9 | 118·0 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**රාජ්‍ය ණය**

රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 23 වැනි හා 24 වැනි සංඛ්‍යා සටහන් වල දැක්වෙයි. පසුගිය මුදල් වර්ෂ පහ අවසානයට තුබූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය (දළ හා ශුද්ධ) ඇතුළත් වන දේශීය හා විදේශීය කොටස් වල කැපී පෙනෙන ලක්ෂණ II (ඉ) 9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා පහතින් විශ්ලේෂණය කර ඇත.

මුදල් වර්ෂය තුළ දී දළ ණය සහ ශුද්ධ ණය වල වැඩිවීම පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 558·5 ක් හා රුපියල් දශ ලක්ෂ 495·7 ක් විය. ඉකුත් මුදල් වර්ෂයේ දී මෙම වැඩි වීම පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 397·4 ක් හා රුපියල් දශ ලක්ෂ 335·9 ක් වී ඇත. රුපියල් දශ ලක්ෂ 558·5 කින් වැඩි වූ දළ ණය, රුපියල් සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 325·0 කින් ද, භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 125·0 කින් ද, විදේශීය ණය රුපියල් දශ ලක්ෂ 59·5 කින් ද, මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 49·5 කින් ද වැඩි වීමෙන් සමන්විත වේ. මෙසේ වැඩි වූ ප්‍රමාණයෙන් කොටසක් බදු සංචිත සහතික වල රුපියල් දශ ලක්ෂ 0·5 ක අඩු වීමකින් මැකී ගියේ ය. 1965/66 මුදල් වර්ෂයේ දී මුළු රාජ්‍ය ණය (ශුද්ධ හා දළ) ප්‍රමාණයේ වැඩිවීම පසුගිය මුදල් වර්ෂ හතර තුළ දී එකම වර්ෂයකදීවත් දක්නට නොලැබුනු වැඩි වීමකි.

සැලකිල්ලට භාජනය වන මුදල් වර්ෂ පහ තුළ දී මුළු ණය ප්‍රමාණයට ඇතුළු වන ශුද්ධ විදේශීය ණය කොටස සියයට 9·6 සිට සියයට 12·2 දක්වා පමණක් වැඩි වූ අතර, නිරපේක්ෂ වශයෙන් බලන විට, එම වැඩිවීම දෙගුණයක් පමණ විය. මෙම කාලය තුළ දී ශුද්ධ දේශීය ණය වැඩි වූයේ පංගු එක හමාරකින් පමණි.

## සංඛ්‍යා සටහන II (ඉ) 9

### මුළු රාජ්‍ය ණය[1]

| සැප්තැම්බර් අවසානයේදී | දළ ණය | | | | | ශුද්ධ ණය (2) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1962 | 1963 | 1964 | 1965 | 1966 |
| අ. වටිනාකම (රුපි. දශ ලක්ෂ) ... | | | | | | | | | | |
| විදේශීය ... | 345·2 | 407·1 | 412·1 | 489·3 | 548·8 | 259·1 | 311·5 | 373·5 | 446·6 | 521·1 |
| දේශීය ... | 2,693·7 | 3,030·2 | 3,375·3 | 3,695·5 | 4,194·5 | 2,429·8 | 2,753·9 | 3,062·5 | 3,325·3 | 3,746·5 |
| එකතුව ... | 3,038·9 | 3,437·3 | 3,787·4 | 4,184·8 | 4,743·3 | 2,688·9 | 3,065·4 | 3,436·0 | 3,771·9 | 4,267·6 |
| ආ. සියයට ගණන් | | | | | | | | | | |
| විදේශීය ... | 11·4 | 11·8 | 10·9 | 11·7 | 11·6 | 9·6 | 10·2 | 10·9 | 11·8 | 12·2 |
| දේශීය ... | 88·6 | 88·2 | 89·1 | 88·3 | 88·4 | 90·4 | 89·8 | 89·1 | 88·2 | 87·8 |
| එකතුව ... | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) මේ රාජ්‍ය ණය සංඛ්‍යාවලට 1966 සැප්තැම්බර් අවසානය වන විට තිබූ රුපියල් දශ ලක්ෂ 75·0 ක ජාතික නිවාස ණයකර සහ රුපියල් දශ ලක්ෂ 33·3 ක රජයේ උකස් බැංකු ණයක් ඇතුළත් නොවේ.

(2) එනම්, නිදන් අරමුදල්වල වටිනාකම අඩුකොට.

**දේශීය ණය**

1965 සැප්තැම්බර් මස 30 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 3,695·5 ක් වූ දළ දේශීය ණය, 1965/66 මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 4,194·5 දක්වා රුපියල් දශ ලක්ෂ 499·0 කින් වැඩි විය. එදිනට මේ ණය සැකැසී තිබුනේ මෙසේය :— රුපියල් සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 2,474·6, භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 1,425·0, බද්ධ සංචිත සහතික රුපියල් දශ ලක්ෂ 32·2, මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 262·6, හා ජාතික සංවර්ධන පිළිනපත් රුපියල් දශ ලක්ෂ 0·1. 1965 හා 1966 සැප්තැම්බර් අවසානයට වූ දේශීය රාජ්‍ය ණය සැකැසීම හා වෙනස්වීම් II (ඉ) 10 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**සංඛ්‍යා සටහන II (ඉ) 10**

**දේශීය රාජ්‍ය ණය සැකැසුම**

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේදී | රුපියල් ණය | | | භාණ්ඩාගාර බිල්පත් | බද්ධ සංචිත සහතික පත් | මහබැංකු අත්තිකාරම් (2) | ජාතික සංවර්ධන පිළින පත් (3) | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අර මුදල්(1) | ශුද්ධ | | | | | දළ | ශුද්ධ |
| 1965 ... | 2,149·6 | 370·2 | 1,779·4 | 1,300·0 | 32·7 | 213·1 | 0·1 | 3,695·5 | 3,325·3 |
| 1966 ... | 2,474·6 | 448·0 | 2,026·6 | 1,425·0 | 32·2 | 262·6 | 0·1 | 4,194·5 | 3,746·5 |
| වෙනස (4) ... | + 325·0 | 77·8 | + 247·2 | + 125·0 | — 0·5 | + 49·5 | — | 499·0 | 421·2 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. නිදන් අරමුදල් වෙනුවෙන් ඇති ආයෝජන වල වෙළෙඳ වටිනාකම පිළිබිඹු වෙයි. (අනුපූරක නිදන් අරමුදල් ඇතුළුව)

2. ජා. මු. අරමුදලට, ජා. ප්‍ර. ස. බැංකුවට හා ජා. ස. ස. ට සාමාජික ගාස්තු වශයෙන් 1965 සැප්තැම්බර් මාසයේ දී ගෙවන ලද රුපියල් කෝටි 6,12 ක හා 1966 සැප්තැම්බර් මාසයේ දී ගෙවන ලද රුපියල් කෝටි 8·24 ක විශේෂ ණය ඇතුළත් වෙයි. මෙම විශේෂ ණය අඩු කළ විට, මුදල් වර්ෂය තුළ මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 2·83 කින් වැඩිවී ඇත.

3. 1966 සැප්තැම්බර් අවසානය වන විට නිකුත් කර තිබුන හා ගෙවීමට තිබුන ජාතික සංවර්ධන පිළිනපත් වල වටිනාකම රුපියල් 70,802 ක් විය.

4. + ලකුණෙන් වැඩිවීමක් දැක්වෙයි.

1966 සැප්තැම්බර් මස 30 වැනි දිනට වූ දළ දේශීය ණයෙහි කල් පිරීමේ පිළිවෙළ, ඉකුත් මුදල් වර්ෂ හතරේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 11 සටහනෙහි දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ දෙක තුළ දී දේශීය ණයෙහි කල් පිරීමේ කාලය දීර්ඝ කැරුන බව, 1965 වාර්තාවේ දක්වන ලදී. මෙම තත්ත්වය, 1965/66 මුදල් වර්ෂය තුළ දී ද එලෙසම පැවැතිණි. අවුරුදු 15 ඉක්මවා මැතම දිනට කල් පිරුන දේශීය ණය ප්‍රමාණය මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 34·4 ක් වූ අතර, මෙය මුදල් වර්ෂය තුළ දී සියයට 2·6 කින් වැඩිවීමකි. මෙයට අනුරූපව, නිස්සදතන ණය ද ප්‍රමාණයෙන් සියයට 41·0 ක් විය.

**රුපියල් සුරැකුම්පත්**

1965/66 මුදල් වර්ෂය තුළ දී නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 351·2 ක් වූ රුපියල් ණය පත් දෙළහෙණ්, රුපියල් දශලක්ෂ 26·2 ක් වූ ණයපත් දෙකක් හැරවුම් ණය වූ අතර, එකක්, රුපියල් දශ ලක්ෂ 7·9 ක වර්ෂ 5 — 7 සියයට 3½ පොළියට මුදලින් ගනු ලැබීය. රුපියල්

## සංඛ්‍යා සටහන II (ඉ) 11

## දේශීය ණය – කල් පිරීම් අනුව

## (සැප්තැම්බර් අවසානයේදී)

රුපියල් දශ ලක්ෂ

| කල්පිරීමේ වර්ෂ | 1962 | | 1963 | | 1964 | | 1965 | | 1966 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| නිෂ්සදකන ණය† | 1,178·4 | 43·7 | 1,346·6 | 44·4 | 1,465·9 | 43·4 | 1,545·9 | 41·8 | 1,719·8 | 41·0 |
| සදකන ණය<br>අවුරුදු 5 ට අඩු* ... | 272·7 | 10·1 | 246·2 | 8·1 | 205·8 | 6·1 | 245·5 | 6·6 | 292·1 | 7·0 |
| අවුරුදු 5 හා 10 අතර* ... | 229·5 | 8·5 | 365·4 | 12·1 | 445·0 | 13·2 | 392·3 | 10·6 | 354·5 | 8·5 |
| අවුරුදු 10 හා 15 අතර* ... | 180·2 | 6·7 | 222·9 | 7·4 | 216·6 | 6·4 | 336·6 | 9·1 | 386·0 | 9·2 |
| අවුරුදු 15 හා 20 අතර* ... | 386·0 | 14·3 | 249·1 | 8·2 | 247·0 | 7·3 | 127·1 | 3·4 | 324·1 | 7·7 |
| අවුරුදු 20 ට වැඩි* ... | 446·8 | 16·6 | 600·0 | 19·8 | 795·0 | 23·6 | 1048·1 | 28·4 | 1,118·0 | 26·7 |
| එකතුව ... | 2,693·7 | 100·0 | 3,030·2 | 100·0 | 3,375·3 | 100·0 | 3,695·5 | 100·0 | 4,194·5 | 100·0 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

† භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත, මහ බැංකු අත්තිකාරම් හා ජාතික සංවර්ධන පිළිනපත් වලින් සමන්විත වේ.

* කල්පිරෙන අවසාන දිනට

## සංඛ්‍යා සටහන I1 (ඉ) 12

## 1965/66 රජයේ සුරැකුම්පත් දයක දීමනා බෙදී ගිය අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1986/90 " ජී " කාණ්ඩය 4½% ණය | 1986/90 "එච්" කාණ්ඩය 4½% ණය | 1970/73 3½% ණය | | 1987/91 4½% ණය | 1987/91 ' බී ' කාණ්ඩය 4½% ණය | 1971/73 3½% ණය | 1987/91 ' සී ' කාණ්ඩය 4½% ණය | 1987/91 ' ඩී ' කාණ්ඩය 4½% ණය | 1987/91 ' ඊ ' කාණ්ඩය 4½% ණය | 1987/91 ' එෆ් ' කාණ්ඩය 4½% ණය | 1969/71 3¼% ණය** | | 1987/91 ' ජී ' කාණ්ඩය 4½% ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | හැරවුම් | මුදල් | | | | | | | | හැරවුම් | මුදල් | | ප්‍රමාණය | සියයට ගණන |
| වෙළෙඳ බැංකු ... | — | — | 14·0 | 1·9 | — | — | 2·0 | — | — | — | — | ... | — | — | 17·9 | 5·1 |
| ඉතිරි කිරීමේ ආයතන ... | 5·5 | 2·5 | — | — | 2·5 | 6·2 | — | — | 3·5 | 8·0 | 6·0 | — | — | 3·0 | 37·2 | 10·6 |
| නිදන් අරමුදල් ... | 12·0 | 16·8 | — | — | 12·5 | 4·3 | — | 10·2 | 14·5 | 3·5 | 14·4 | — | 6·6 | 9·7 | 104·5 | 29·8 |
| දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලයීය අරමුදල් ... | 0·7 | 0·3 | — | — | 1·0 | — | — | — | — | 1·5 | 0·2 | — | — | — | 3·7 | 1·1 |
| භාරකාර මණ්ඩල, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් | | | | | | | | | | | | | | | | |
| (1) සේවක අර්ථසාධක අරමුදල | 6·3 | 7·0 | — | — | 10·2 | 7·9 | — | 8·5 | 6·4 | 11·0 | 9·2 | — | — | 8·1 | 74·6 | 21·2 |
| (2) අනෙකුත් ... | 3·7 | 2·4 | 0·1 | ... | 3·5 | 6·5 | 0·1 | 3·7 | 3·0 | 3·9 | 2·8 | 0·6 | 0·5 | 8·4 | 39·2 | 11·2 |
| රක්ෂණ අරමුදල් :— | | | | | | | | | | | | | | | | |
| (1) රක්ෂණ සංස්ථාව ... | 4·7 | 4·7 | — | — | 4·5 | 6·3 | — | 5·0 | 6·0 | 5·0 | 4·0 | — | — | 6·0 | 46·2 | 13·2 |
| (2) රක්ෂණ සමාගම් ... | 0·9 | 0·3 | 0·3 | 1·5 | 0·2 | 2·0 | 1·5 | 0·2 | 0·9 | 1·3 | 0·3 | 0·1 | — | 1·1 | 10·6 | 3·0 |
| අනෙකුත් සමාගම් ... | 0·2 | — | — | — | — | — | — | — | 0·1 | 0·1 | ... | — | — | 0·1 | 0·5 | 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන ... | 1·1 | 1·0 | — | 0·6 | 0·6 | 1·8 | 4·2 | 4·5 | 0·7 | 0·7 | 0·6 | 0·1 | ... | 1·1 | 17·0 | 4·8 |
| එකතුව ... | 35·0 | 35·0 | 14·4 | 4·0 | 35·0 | 35·0 | 7·9 | 32·1 | 35·0 | 35·0 | 37·5 | 0·7 | 7·1 | 37·5 | 351·2 | 100·0 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1965 දෙසැම්බර් මාසයේ දී ආපසු ගෙවීමට නියමිත තුබූ 1963/65 ' බී ' කාණ්ඩයේ 2½% ලංකාණ්ඩුවේ ණය මුදල හැරවීමෙන් මෙම ණය මුදල ලබා ගන්නා ලදී.

** 1966 අගෝස්තු මාසයේ දී ආපසු ගෙවීමට නියමිතව තුබූ 1964/66, 3% ලංකාණ්ඩුවේ ණය මුදල හැරවීමෙන් මෙම ණය මුදල ලබා ගන්නා ලදී.

දශ ලක්ෂ 317·1 ක එකතුවක් සඳහා වූ ඉතිරි ණය පත් නවය ද (වර්ෂ 21 — 25) සියයට 4½ පොළියට මුදලින් ගනු ලැබූ ඒවා විය. හැරවුම් ණය දෙකෙන්, 1970/73 සියයට 3½ ණය පත්, 1963/65 'බී' කාණ්ඩයේ සියයට 2½ ණය පත් හැරවීමෙන් උපයනු ලැබූ අතර, 1969/71 සියයට 3¼ ණය පත උපයන ලද්දේ වර්ෂය තුළ දී කල් පිරුණ 1964/66 සියයට 3 ණය පත හැරවීමෙනි. අනෙක් ණය පත් දහයම සම්පූර්ණයෙන් ම මුදලින් ලැබූ ඒවා විය. ණයපත් බෙදී ගිය අයුරු II (ඉ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි වර්ග කොට දැක්වේ :—

II (ඉ) 12 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, නිකුත් කරන ලද ණය පත් වලින් රුපියල් දශ ලක්ෂ 104·5 ක් (සියයට 29·8) ලබා ගෙන ඇත්තේ නිදන් අරමුදල් ය. ණයපත් ලබා ගෙන ඇති අනෙකුත් ප්‍රධාන දයකයන් මෙසේ ය :— සේවක අර්ථ සාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 74·6 (සියයට 21·2), රක්ෂණ සංස්ථාව රුපියල් දශ ලක්ෂ 46·2 (සියයට 13·2), භාර කාර මණ්ඩල සුභසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් සහ අර්ථ සාධක අර මුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) රුපියල් දශ ලක්ෂ 39·2 (සියයට 11·2) හා ඉතිරි කිරීම් ආයතන රුපියල් දශ ලක්ෂ 37·2 (සියයට 10·6)

1964/65 හා 1965/66 දී රජයේ සුරැකුම්පත් බෙදී ගිය අයුරු පසුගිය මුදල් වර්ෂ දෙකේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 13 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත :—

**සංඛ්‍යා සටහන II (ඉ) 13**

**1962/63 — 1965/66 රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු වර්ග කිරීම**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | | 1963/64 | | 1964/65 | | 1965/66 | | 1964/65 ට වඩා 1965/66 වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | |
| බැංකු අංශය : | | | | | | | | | |
| වෙළඳ බැංකු ... | 25·4 | 11·5 | 33·0 | 10·5 | 1·0 | 0·4 | 17·9 | 5·1 | +16·9 |
| සමූපකාර ප්‍රාදේශීය බැංකු | 0·3 | 0·1 | – | – | – | – | – | – | – |
| බැංකු නොවන : | | | | | | | | | |
| ඉතිරි කිරීමේ ආයතන ... | 17·3 | 7·8 | 79·9(1) | 25·4 | 38·8 | 14·7 | 37·2 | 10·6 | — 1·6 |
| නිදන් අරමුදල් ... | 36·4 | 16·4 | 46·3 | 14·7 | 52·5 | 19·9 | 104·5 | 29·8 | +52·0 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් ... | 7·5 | 3·4 | 21·4 | 6·8 | 14·4 | 5·5 | 3·7 | 1·1 | —10·7 |
| භාරකාර මණ්ඩල, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් | | | | | | | | | |
| 1. සේ. අ. අ. ... | 67·8 | 30·6 | 65·0 | 20·6 | 72·4 | 27·4 | 74·6 | 21·2 | + 2·2 |
| 2. අනෙකුත් ... | 36·6 | 16·5 | 25·8 | 8·2 | 31·5 | 11·9 | 39·2 | 11·2 | + 7·7 |
| රක්ෂණ අරමුදල් ... | | | | | | | | | |
| 1. රක්ෂණ සංස්ථාව ... | 12·9 | 5·8 | 29·0 | 9·2 | 42·2 | 16·0 | 46·2 | 13·2 | + 4·0 |
| 2. රක්ෂණ සමාගම් | 13·4 | 6·1 | 8·9 | 2·8 | 6·6 | 2·5 | 10·6 | 3·0 | + 4·0 |
| අනෙකුත් රජයේ සමායතන | – | – | 3·5 | 1·1 | – | – | – | – | – |
| අනෙකුත් සමාගම් ... | 0·8 | 0·4 | 0·3 | 0·1 | 0·2 | 0·1 | 0·5 | 0·1 | + 0·3 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන ... | 3·2 | 1·4 | 1·7 | 0·5 | 4·6 | 1·7 | 17·0 | 4·8 | +12·4 |
| එකතුව ... | 221·3 | 100·0 | 315·0 | 100·0 | 263·9(2) | 100·0 | 351·2(3) | 100·0 | +87·3 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) මෙම ප්‍රාමණයෙන් රුපියල් දශ ලක්ෂ 52·5 ක් 1974 සියයට 3¾ නේ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් සමන්විතයි.

(2) මෙම ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 4·6 ක් 1971 සියයට 3½ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් ද රුපියල් කෝටි 0·69 ක් 1972 සියයට 3½ රේ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් ද සමන්විතයි.

(3) මෙමප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 18·4ක් 1970/73 සියයට 3½ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින්ද රුපියල් දශ ලක්ෂ 7·8 ක් 1969/71 සියයට 3¼ හැරවුම් ණය සඳහා වූ දයක දීමනා වලින් ද සමන්විතයි.

1965/66 දී රජයේ සුරකුම්පත් වලට දයක වී ඇති පිළිවෙළෙහි කැපී පෙනෙන ලක්ෂණයක් නම්, පුද්ගලයන්, සමිති සමාගම් හා ආයතන විසින් මිලයට ගනු ලැබූ සුරකුම්පත් අනුපාතය වේගයෙන් වැඩි වීමයි. (රුපියල් දශ ලක්ෂ 17·0 හෙවත් මුළු සුරකුම්පත් වලින් සියයට 4·8) මෙම වැඩි වීම සිදු වී ඇත්තේ 1963 අංක 4 දරන දේශීය ආදයම් පනත සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව පුද්ගලයන් රජයේ සුරකුම්පත් වලට කරන ආයෝජන මේ පනතේ 69 ' ඒ ' වගන්තිය යටතේ බදු සහන ලැබීම සඳහා අනුමත ඉතිරි කිරීම් ලෙස සැලකීමට ඉඩ ලැබිණි. මෙම වැඩි වීම 1966 මාර්තු/අප්‍රේල් වල නිකුත් කරන ලද (වර්ෂ 5 — 7) සියයට 3½ ණයපත් සහ (වර්ෂ 21 — 25) සියයට 4 ණය පත බෙදී ගිය අන්දමින් පෙන්නුම් කෙරේ.

දිගු කාලීන (වර්ෂ 21 — 25) රජයේ ණය සඳහා වූ පොළී අනුපාතිකය 1963 ජූනි 1 වැනි දින සියයට 4½ සිට සියයට 4½ දක්වා වැඩි කරන ලදුව, එතැන් පටන්, එය එම මට්ටමෙහි ම පැවතිණි.

**භාණ්ඩාගාර බිල්පත්**

මුදල් වර්ෂය ඇරඹෙන විට නොබේරා තිබුණ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,300·0 ක් විය. එදිනට බලය ලත් සීමාව වූයේ රුපියල් දශ ලක්ෂ 1,500·0 කි. මුදල් වර්ෂය අවසානය වන විට, නොබේරා තිබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,425·0 ක් වූ අතර, එය මුදල් වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 125·0 ක වැඩි වීමක් දක්වයි. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට හැකි සීමාවෙන් උපයෝගී කර නොගත් ශේෂය රුපියල් දශ ලක්ෂ 75·0 ක් විය.

1966 සැප්තැම්බර් අවසානයේ දී බැංකු ක්‍රමය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,369·3 (නොබේරන ලද සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට 96·1) ක් විය. මෙය, 1965 සැප්තැම්බර් 30 වැනි දින දී රුපියල් දශ ලක්ෂ 1,233·8 (සියයට 94·9) ක් විය. 1966 සැප්තැම්බර් අවසානයේ දී බැංකු ක්‍රමය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙන් මහ බැංකුව සතුව පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1257·9 (සියයට 88·3) ක් වූ අතර 1965 සැප්තැම්බර් 30 වැනි දිනට මහ බැංකුව සතුව පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1106·5 (සියයට 85·1) ක් විය.

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොළී අනුපාතිකයේ වෙනසෙක් නොවී, එය සියයට 3·0 ක්ව පැවතිණි. මහ බැංකුව විසින් මිල දී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබුණු වාර්ෂික පොළිය ද සියයට 1·0 ක් ලෙස මුදල් වර්ෂය අවසානය දක්වා ම නොවෙනස්ව පැවැතිණි.

**විදේශීය ණය**

1965/66 දී දළ විදේශීය ණය (ආපසු ගෙවීම් අඩු කර එහෙත් නිදන් අරමුදල් අඩු කිරීම ට ප්‍රථම) රුපියල් දශ ලක්ෂ 59·6 කින් වැඩි විය. 1964/65 දී මෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 77·1 ක් විය. 1965/66 දී ඇති වූ වැඩිවීම II (ඉ) 14 සංඛ්‍යා සටහනෙහි විග්‍රහ කොට දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (ඍ) 14

## විදේශීය ණය

රුපියල් දශ ලක්ෂ

| | 1965/66 දී වැඩිවීම* | 1966 සැප්තැම්බර් 30 වැනි දිනට වගකීම |
|---|---|---|
| (අ) යෝජනා ක්‍රම ණය ... ... ... ... ... | | |
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකු ණය ... ... | – 1·2 | 138·5 |
| අමෙරිකා එක්සත් ජනපදයේ අයි. සී. ඒ. ණය ... ... | 17·8 | 52·8 |
| චීන ණය ... ... ... ... ... | 9·7 | 50·2 |
| බටහිර ජර්මන් (ක්‍රෙඩිට්ටැන්ස්ටෝල්ට්) ණය ... ... ... | 5·5 | 24·7 |
| රන්පවුම් ණය ... ... ... ... ... | –24·6 | 83·3† |
| අමෙරිකා එක්සත් ජනපදයේ ඒ. අයි. ඩී. ණය ... ... | 7·0 | 7·0 |
| අමෙරිකා එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදලේ ණය ... | – 1·0 | 9·7 |
| කනේඩියානු ණය ... ... ... ... ... | – 1·3 | 3·4 |
| කැනේඩියානු අ. ණ. ර. ස. ණය ... ... ... ... | 1·3 | 17·0 |
| එක්සත් රාජධානියේ ණය මාලාව ... ... ... ... | – 0·7 | 20·1 |
| සෝ. ස. ස. සං. යේ ණය මාලාව ... ... ... ... | 9·3 | 92·3 |
| යුගෝස්ලේවියානු ණය මාලාව ... ... ... ... | 0·8 | 4·9 |
| පෝලන්ත ණය මාලාව ... ... ... ... ... | 0·1 | 2·5 |
| ප්‍රංස එස්. ඕ. සී. ඊ. ඒ. ණය ... ... ... ... | 1·6 | 7·1 |
| (ආ) භාණ්ඩ ණය ... ... ... ... ... | | |
| (1) කැනඩාව ... ... ... ... ... | 2·4 | 2·4 |
| (2) එක්සත් රාජධානිය ... ... ... ... ... | 18·9 | 18·9 |
| (3) බටහිර ජර්මනිය (ක්‍රෙඩිට්ටැන්ස්ටෝල්ට්) ... ... | 1·2 | 1·2 |
| (4) ජපානය ... ... ... ... ... | 10·0 | 10·0 |
| (5) ඉන්දියාව ... ... ... ... ... | 2·6 | 2·6 |
| එකතුව ... | 59·6 | 548·8 |

* එනම්, ආපසු ගෙවුම් හැර ආපසු ලබා ගැනීම්

† රන් පවුම් සුරැකුම්පත් බේරීම සඳහා පවත්වාගෙන යන ලද නිදන් අරමුදල් රුපියල් දශ ලක්ෂ 27·7 ක් විය. මෙම නිදන් අරමුදල් සඳහා ගැලපීම් ඇති කිරීමෙන් පසු ශුද්ධ වගකීම් රුපියල් දශ ලක්ෂ 521·1 ක් විය.

– සලකුණින් ශුද්ධ ආපසු ගෙවීම් දැක්වෙයි.

පහත සඳහන් ණය සඳහා ගිවිසුම් අත්සන් කොට තුබුන ද, 1965/66 මුදල් වර්ෂය තුළදී ඒවායින් මුදල් ලබා ගෙන නොමැත.

| | | | ප්‍රමාණය | ගිවිසුමේ දිනය |
|---|---|---|---|---|
| 1. | පැරිස් බැංකුවේ (ප්‍රංශය) ණය මාලාව | පවුම් | 1,00,00,000 | 64-12- 1 |
| 2. | ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුවේ ණය මාලාව | පවුම් | 1,50,00,000 | 65- 2- 2 |
| 3. | කටුනායක සංවර්ධන ක්‍රමය සඳහා කැනේඩියානු ණය | කැ. ඩො. | 15,00,000 | 66- 3-22 |
| 4. | 1966 එ. රා. ලංකා ද්‍රව්‍ය ණය | පවුම් | 15,70,000 | 66- 5-14 |
| 5. | ක්‍රෙඩිට්ටැන්ස්ටෝල්ට් (බටහිර ජර්මනිය) ණය* | ඩී.ඇම් | 1,80,00,000 | 66- 6-30 |
| 6. | ක්‍රෙඩිට්ටැන්ස්ටෝල්ට් (බටහිර ජර්මනිය) ද්‍රව්‍ය ණය* | ඩී.ඇම්. | 2,50,00,000 | 66- 8-20 |
| 7. | ප්‍රංස ද්‍රව්‍ය ණය | ප්‍ර. ප්‍රැ | 4,00,00,000 | 66- 8-31 |
| 8. | ජපන්/ලංකා ද්‍රව්‍ය ණය අංක 2 – 1966 | යෙන් | 1,80,00,00,000 | 66- 9- 6 |
| 9. | එ. ජා./ලංකා ද්‍රව්‍ය ණය අංක 2 – 1966 | පවුම් | 20,00,000 | 66- 9- 26 |

* මෙම ණය මූලික ගිවිසුම් වල ස්වභාවයෙන් වූ ඒවාය.

ප්‍රධාන වශයෙන් ම පහත සඳහන් හේතූන් නිසා 1965/66 මුදල් වර්ෂය තුළ දී මේම ණය ප්‍රයෝජනයට ගෙන නොමැත :—

(අ) ණය උපයෝගි කර ගැනීමේ ක්‍රියා පිළිවෙත තීරණය කර ගැනීමේ දී ඇති වූ ප්‍රමාද යන්,

(ආ) කැනඩා ණය මුදලේ දී මෙන්, ණය මුදල් ගෙවීම් ණය දෙන රාජ්‍යයන් මගින් කෙළින් ම කරන විට, එවැනි ගෙවීම් පිළිබඳ උපදෙස් ප්‍රමාද වීම,

(ඇ) භාණ්ඩ ණය වල දී, ආනයනකරුවන් විසින් භාණ්ඩ ඇණවුම් කිරීමත්, සපයන්නන් විසින් එම ඉල්ලුම් ඉටු කිරීමත් අතර ඇති වන ප්‍රමාදය, විශේෂයෙන් ම මෙය යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් සිදු වේ.

## නිදන් අරමුදල්

සදතන රාජ්‍ය ණය බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදල් වල වෙළෙඳ වටිනාකම 1965/66 මුදල් වර්ෂය අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 475·7 ක් විය. මෙයින් මුදල් වර්ෂය තුළ දී ඇති වූ රුපියල් දශ ලක්ෂ 62·7 ක ශුද්ධ වැඩි වීමක් පෙන්නුම් කෙරේ. මෙම වැඩි වීම සැකැසී ඇත්තේ පහත සඳහන් අයුරුය :—

| | | |
|---|---|---|
| නිදන් අරමුදලට දායක දීමනා | රුපියල් දශ ලක්ෂ 60·3 | |
| ආයෝජන සඳහා පොළිය | රුපියල් දශ ලක්ෂ 16·6 | |
| ආයෝජන වල වෙළෙඳ වටිනාකමෙහි අගය වැඩි වීම | රුපියල් දශ ලක්ෂ 4·2 | රුපියල් දශ ලක්ෂ 81·1 |
| ණය ආපසු ගෙවීම සඳහා උපයෝගී කර ගත් ප්‍රමාණය අඩු කොට | | රුපියල් දශ ලක්ෂ 18·3 |
| ශුද්ධ වැඩිවීම | | රුපියල් දශ ලක්ෂ 62·7 |

## අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය

රජයේ අවශ්‍යතාවන් සඳහා සෑම සම්පත් මාර්ගයක් ම සපයා දීමෙන් ද, ජාතික නිවාස කොමසාරිස් ගේ අවශ්‍යතා හා රජයේ මුදල් තත්ත්වයක් ද අනුව ම එම ආයතනයට අවශ්‍ය මුදල් රජයේ ණය අරමුදල් වලින් ණයට දෙන ලෙස රජයට උපදෙස් දෙමින් ද, මහ බැංකුව පසුගිය මුදල් වර්ෂ තුනේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිය ම අනුගමනය කළාය.

### (1) ජාතික නිවාස දෙපාර්තමේන්තුව

ජාතික නිවාස ණයකර 1965/66 මුදල් වර්ෂයේ දී නිකුත් නොකැරිණි. නිකුත් කර නො බේරන ලද ජාතික නිවාස ණයකර වල එකතුව රුපියල් දශ ලක්ෂ 75·0 ලෙස ම පැවතිණි. රජය විසින් අනුමත කැරුන සෘජු ණය එකතුව වූ රුපියල් දශ ලක්ෂ 70·0 1966 සැප්තැම්බර් මාසය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 90·0 දක්වා වැඩි විණි. මෙය මුදල් වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 20·0 ක වැඩි වීමකි. මේ අනුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ණය ලබා ගැනීමේ සීමාවෙන් රුපියල් දශ ලක්ෂ 50·0 ක ශේෂයක් ඇති විය. ජාතික නිවාස ණයකර බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදල් වල වටිනාකම මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 32·5 ක් විය.

## (II) රජයේ උකස් බැංකුව

සාකච්ඡාවට භාජනය වන මුදල් වර්ෂය තුළ දී රජයේ උකස් බැංකුව අළුත් ණයකර නිකුත් කොට නොමැත. නිකුත් කර නොබේරන ලද ණයකර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 33·3 ක් ව පැවතිණි. එහි ගනුදෙනු කර ගෙන යාමට බොහෝ සෙයින් ම පිහිට කර ගනු ලැබුයේ බැංකු ක්‍රමයෙන් සැලසුන අයිරා පහසුකම් ය. රජයේ උකස් බැංකුවේ ණය ලබා ගැනීමේ සීමාව රුපියල් දශ ලක්ෂ 70·6 දක්වා රුපියල් දශ ලක්ෂ 3·0 කින් වැඩි කරනු ලැබූ අතර, 73·75 සහ 84 වැනි වගන්ති යටතේ ඇප වුන අයිරා රුපියල් දශ ලක්ෂ 5·0 ක වැඩි වීමක් පිළිබිඹු කරමින් මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 37·4 දක්වා වැඩි විය. නිකුත් කර නොබේරන ලද ණය කර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 33·3 ක් වූ හෙයින්, මෙහි දී සාකච්ඡාවට භාජනය වන කාල ජෙදය අවසානයේ දී ණය ලබා ගැනීමේ සීමාවෙන් ශේෂයක් ඉතිරිව නොතිබිණි.

### (ආ) කොටස – 1966/67 මුදල් වර්ෂය

### 1966/67 අය වැය ලේඛනය

1966/67 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් 1966 සැප්තැම්බර් 26 වැනි දින අනුමත කරන ලද ආදයම් හා වියදම් පිළිබඳ මුල් ඇස්තමේන්තු II (ඉ) 15 වැනි සංඛ්‍යා සටහනේ පිඩුකොට දක්වා ඇත :—

**සංඛ්‍යා සටහන II (ඉ) 15**

**මුල් අය වැය ඇස්තමේන්තු**

රුපියල් දශ ලක්ෂ

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ආවර්තන වියදම් (වැය සම්මත 1, 2, 4 හා 6) | ... | 2,082·0 | |
| | සියයට 2½ ක ඌන වියදම් අඩු කොට* | ... | 49·3 | 2,032·7 |
| (ආ) | ප්‍රාග්ධන වියදම් (වැය සම්මත 3, 5, හා 7) | ... | 761·7 | |
| | සියයට 10 ක ඌන වියදම් අඩුකොට | ... | 76·2 | 685·5 |
| (ඇ) | මුළු වියදම (අ) + (ආ) | ... | | 2,718·2 |
| (ඈ) | ආදයම් (නව බදු ලැබීම් ඇතුළත්ව) | ... | | 2,033·0 |
| (ඉ) | අය වැය හිඟය (ඇ) – (ඈ) | ... | | 685·2 |
| (ඊ) | නිදන් අරමුදල් සඳහා දයක දීමනා හා රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැර | ... | | 109·0 |
| (උ) | ඇස්තමේන්තු කළ ශුද්ධ අය වැය හිඟය | ... | | 576·2 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රුපියල් දශ ලක්ෂ 1,973·0 සියයට 2½ : මෙම සංඛ්‍යාව ලබාගත්තේ ආවර්තන වියදමෙන් නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් කැරෙන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් (රුපියල් දශ ලක්ෂ 109·0) අඩු කිරීමෙනි.

රුපියල් දශ ලක්ෂ 685·2 වූ අය-වැය හිඟය පියැවූයේ මෙසේ ය :–

| | | රුපියල් දශ ලක්ෂ |
|---|---|---|
| (අ) | බැංකු නොවන දේශීය මාර්ග වලින් ණය ... ... ... ... | 325·0 |
| (ආ) | විදේශාධාර (යෝජනා ක්‍රම) ... ... ... ... | 125·0 |
| (ඇ) | පරිපාලන ණය ... ... ... ... | 25·0 |
| (ඈ) | ප්‍රතිපාර්ශ්වීය අරමුදල් (භාණ්ඩ ආධාර) ... ... ... ... | 150·0 |
| | | 625·0 |

මේ අනුව ඇති වන නොපියවූ රුපියල් දශ ලක්ෂ 60·2 අය වැය හිඟය බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය මුදල් වලින් පියවනු ඇත.

**ආදයම**

1966/67 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු ආදයම (අයවැය ලේඛනයෙන් යෝජිත විධිවිධාන වලින් ලැබෙන රුපියල් දශ ලක්ෂ 75·0 ක ශුද්ධ ලැබීමක් ද ඇතුළුව) රුපියල් දශ ලක්ෂ 2,033·0 ක් විය. මෙම ආදයම 1965/66 දී ද රුපියල් දශ ලක්ෂ 1,833·2 ක් වූ නියම (තාවකාලික) ආදයම සමග සැසැඳිය හැකිය. මේ අනුව, මෙම මුදල් වර්ෂයේ අය වැය ඇස්ත මේන්තු වලින් දක්වෙන ආදයම 1965/66 මුදල් වර්ෂයේ නියම (තාවකාලික) ආදයමට වඩා රුපියල් දශ ලක්ෂ 199·8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

පසුගිය වර්ෂයේ දී ලැබූ නියම ආදයමට වඩා රුපියල් දශ ලක්ෂ 199·8 ක් වූ මෙම වැඩිවීම සැකැසෙනුයේ ප්‍රධාන වශයෙන් ම, පහත සඳහන් මාර්ගයන් ගෙන් බලාපොරොත්තු වන ආදයම් වැඩිවීම් මගිනි. රේගු බදු (රුපියල් දශ ලක්ෂ 149·3) දේශීය භාණ්ඩ බදු (රුපියල් දශ ලක්ෂ 51·3) විදුලි දෙපාර්තමේන්තුව (රුපියල් දශ ලක්ෂ 13·5) පොළිය හා වාර්ෂිකයන් (රුපියල් දශ ලක්ෂ 12·8). මෙම ආදයම් වැඩිවීම ආදයම් බදු වලින් ලැබෙන ආදයම (රුපියල් දශ ලක්ෂ 14·1 කින්) සහ වරාය හා නැව් තොට ආදයම් (රුපියල් දශ ලක්ෂ 5·3 කින්) අඩුවීම නිසා තරමකට මැකී ගියේ ය.

1966/67 සඳහා ආදයම් එකතුවෙන් විශාල ම වැඩි වීමක් බලාපොරොත්තු වනුයේ 1 වැනි ශීර්ෂය වන රේගු බදු වලිනි. ආනයන තීරු බදු වලින් ලැබෙන ආදයම රුපියල් දශ ලක්ෂ 124·3 කින් ද, අපනයන තීරු බදු ආදයම රුපියල් දශ ලක්ෂ 25·2 කින් ද වැඩි වේ යයි අපේක්ෂා කෙරේ. කපු නූල්, රෙදිපිළි ආදියෙන් (රුපියල් දශ ලක්ෂ 13·8) මෝටර් රථ ස්ප්‍රිතු හා ද්‍රව ඉන්ධන වලින් (රුපියල් දශ ලක්ෂ 33·0) පොහොර වලින් (රුපියල් දශ ලක්ෂ 3·4) ප්‍රවාහණ උපකරණ වලින් (රුපියල් දශ ලක්ෂ 11·5) හා සීනි වලින් (රුපියල් දශ ලක්ෂ 10·1) ලැබෙන ආනයන තීරු බදු ඉහත කී ආදයම් වැඩිවීම කෙරෙහි සැලකිය යුතු අන්දමින් බලපානු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. අපනයන තීරු බදු ආදයමෙන් කැපී පෙනෙන වැඩිවීමක් ඇති වනුයේ පොල් තෙල් (රුපියල් දශ ලක්ෂ 14·1) හා රබර් (රුපියල් දශ ලක්ෂ 4·0) වෙනුවෙන් ය.

**නව බදු යෝජනා හා අනෙකුත් ආදයම් විධිවිධානයන්**

අය වැය ලේඛනයේ ඇතුළත් නව බදු යෝජනා හා අනෙකුත් ආදයම් විධිවිධානයන් හේතු කොට ගෙන ආදයම රුපියල් දශ ලක්ෂ 75·0 කින් වැඩි වේ යැයි ද, වියදම, රුපියල් දශ ලක්ෂ 25·0 කින් අඩු වී යැයි ද බලාපොරොත්තු වනු ලැබේ. මේ අඩු වැඩි වීම් පහත දක්වා ඇති පරිදි වේ. :—

| | රුපියල් දශ ලක්ෂ<br>ආදයම | <br>වියදම |
|---|---|---|
| 1. ආනයන තීරු බදු සංශෝධනය ... ... ... ... ... | + 15·0 | |
| 2. ආනයන පරිමාව වැඩිවීමට හේතු කොට ගෙන ආනයන තීරු බදු වලින් ලැබෙන ආදායමේ වැඩිවීම ... ... ... ... ... | + 20·0 | |
| 3. පිරිවැටුම් බදු ... ... ... ... ... | + 30·0 | |
| 4. ස. තො. ස. විසින් කැරෙන රෙදිපිළි ආනයන සඳහා වූ ආනයන බලපත්‍ර ගාස්තුව... | + 10·0 | |
| 5. පිටි මිල වැඩිවීම ... ... ... | | — 25·0 |
| එකතුව ... ... ... | + 75·0 | — 25·0 |

## (I) ආනයන බදු

තීරු බදු සම්බන්ධයෙන් ගත් අළුත් ආදයම් විධිවිධාන ප්‍රධාන වශයෙන් සකස් වූයේ, වර්ත මාන තීරු බදු ව්‍යුහයේ දුර්වලතා පරීක්ෂා කිරීමට පත් කළ විශේෂ කමිටුවේ යෝජනා පදනම් කර ගෙනය. මෙම විශේෂ කමිටුවේ යෝජනා අනුව යමින් මෙම අයවැය ලේඛනයට[1] කලින් ම සියළු අමු ද්‍රව්‍ය වර්ග අඩංගු වන 30 % මට්ටමේ ඒකාකාර (පොදු) තීරු බද්දක් පනවන ලදී. දේශීය අමු ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීමට බාධා පැමිණෙන්නට ඉඩ ඇතැයි හෝ දේශීය අමු ද්‍රව්‍ය වල දියුණුව වැලැක්වෙතැයි ඇතැයි හෝ පෙනී ගිය තැන් වල දී තීරු බදු අනුපාතිකය වැඩි කරන ලදී. මෙම ඒකාකාර තීරු බදු අනුපාතිකය යෙදවීමේ ප්‍රතිඵලය විය හැක්කේ සමහර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙවිය යුතු තීරු බද්ද වැඩිවීමත්, තවත් සමහර භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු තීරු බද්ද අඩුවීමත්ය.

අමු ද්‍රව්‍ය, කාර්මික යන්ත්‍රෝපකරණ හා අමතර කොටස් වෙනුවෙන් දැනට පවත්නා 22% අනුග්‍රහ අනුපාතිකය (සාමාන්‍ය ) 10% තෙක් අඩු[2] කරන ලදී. මෙය කරන ලද්දේ ආර්ථික ක්‍රමයේ ශීඝ්‍ර වෘද්ධිය සඳහා අත්‍යාවශ්‍ය මූලික කර්මාන්ත පුළුල් වීම සඳහා දිය යුතු සෑම අනුබල යක් ම දෙන ලද බවට වග බලා ගනු වස් ය  මෙම අළුත් පහළ අනුපාතිකයට ඉඩ සැලසීම් වස් යෙද වූ නව තීරු බද්ද මගින් කරන ලද තවත් නියමයක් නම්, මෙකී සහන දිය යුත්තේ '' අත්‍යා වශ්‍ය කර්මාන්ත'' වලට පමණක්ය යන බවයි. ආනයන තීරු බදු වල ඉහත කී වෙනස්කම් කිරී මේ දී අපනයන වෙළෙඳාමට සම්බන්ධ ශීර්ෂ පිළිබඳ තීරු බදු, වැඩි නො කිරීමට ද වග බලා ගන්නා ලදී.

සියයට 200 සිට 300 දක්වා වූ භාණ්ඩ ආනයන කිරීම අධෛර්‍ය කරන සුළු ඉහළ තීරු බදු අනුපාතිකයන් සමහර භාණ්ඩ වර්ග සම්බන්ධයෙන් පනවා තිබුනේ, ඒවා ආනයනය කිරීම වැලැක්වීමටය. මෑත වර්ෂ වල දී වැඩි දියුණු කර ගෙන ආ ආනයන ද්‍රව්‍යාත්මකව පාලනය කැරෙන වැඩ පිළිවෙළක් යෙදීම නිසා මෙම ඉහළ තීරු බදු අනුපාතික තව දුරටත් පවත්වා ගෙන යාම අනවශ්‍ය විය. එහෙයින්, සමහර විශේෂ අවස්ථා වල දී හැර, අන් සියළු තැන් හි දී ම තීරු බදු අනුපාතිකයන් සියයට 150[3] උපරිමය (සාමාන්‍ය) දක්වා බස් වන ලදී. එසේ වුවද, සමහර තැන් වල දී මෙයට වඩා ඉහළ අනුපාතිකයනට ඉඩ දෙන ලද්දේ දේශීය කර්මාන්ත වලට ආරක්ෂණයක් වශයෙන් හා මිල අධික හෝ සුඛෝපභෝගී භාණ්ඩ ආනයන කිරීම පිළිබඳව දඬුවම් පැමිණිවීමක් වශයෙන් ය.

තීරු බදු පිළිබඳව තව දුරටත් කැරුන වෙනස්කම් අතර, බටර්, කපුරු, යීස්ට්, මද්‍ය සාර වර්ග, කාර්මික රසායනික කුඩු වැනි වෙළෙඳ භාණ්ඩ සඳහා ඒවායේ තිබෙන අගය අනුව තීරු බදු අය කිරීම වෙනුවට නිශ්චිත තීරු බදු ආදේශනය කිරීම ද විය. මේ ආදේශනය ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන අයවැය ලේඛනයේ සඳහන් නිශ්චිත බදු වෙනුවෙන් දක් වූ වරණය තව දුරටත් පුළුල් කිරීමකි.

තීරු බදු වල ඇති වූ මෙම වෙනසෙහි ප්‍රතිඵලයක් වූයේ වර්ෂයේ ආදයම රුපියල් දශ ලක්ෂ 15 ක් පමණ සුළු ප්‍රමාණයකින් වැඩි වීමයි. 1966/67 මුදල් වර්ෂය තුළ දී ආනයන ප්‍රමාණය වැඩි කිරීම හේතු කොට ගෙන ආනයන තීරු බදු වශයෙන් ලැබෙන ආදයම තවත් රුපියල් දශ ලක්ෂ 20·0 කින් වැඩි වේ යැයි බලාපොරොත්තු වනු ලැබේ.

---

(1) 1966 ජූලි 29 වැනි දින හා අංක 14706/4 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රය.

(2) එහිම.

(3) 1966 ජූලි 29 වැනි දින හා අංක 14706/4 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රය.

## (II) බූදල් බද්ද

අඩු ආදායම් ලබන පංති වලට සහන සැලසීමක් වශයෙන් බූදල් බද්දෙන්[1] නිදහස් කිරීමේ සීමාව, රුපියල් විසි දහේ සිට රුපියල් පනස් දහ දක්වා තව දුරටත් වැඩි කරන ලදී. රුපියල් පනස් දහට වැඩි මුදල් සඳහා තක්සේරු කර ඇති රුපියල් දශ ලක්ෂ 8·0 න් රුපියල් දශ ලක්ෂ 6·0 ක් සැකැසෙනුයේ නිශ්චල දේපළ වලිනි. එහෙයින් බූදල් බදු ගෙවීමේ දී විශේෂයෙන් ම දෙමව් පියන්ගේ දේපළ දරුවන් කීප දෙනෙකුට උරුම වූ අවස්ථා වල බදු ගෙවීමේ දී පවුල් වලට සැලකිය යුතු තරමේ දුෂ්කරතා සිදු වී ඇත.

බූදලයේ අගය රුපියල් පනස්දහ ඉක්මවන විට, බදු ගෙවිය යුතු මුල් ඉම රුපියල් විසි දහේ සිට රුපියල් පනස්දහ තෙක් නොවෙනස්ව පවත්නා අතර, ගෙවිය යුතු බද්ද 3% කි. අගය රුපියල් පනස් දහ යන්තම් ඉක්මවා සිටින ආන්තික අවස්ථාවන් පිළිබඳ සහනයක් දීම සඳහා බදු ගෙවීමෙන් පසු බූදලය රුපියල් පනස් දහට අඩු නොවීමට ඉඩ සලසා තිබේ. මෙම පියවරේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ආදයමේ අඩුව රුපියල් 1,50,000 ක් පමණ වේ යයි බලා පොරොත්තු වේ.

බූදල් බදු අය කිරීම සඳහා ගම්බද පෙදෙස් වල පිහිටි දේපළ වල වටිනාකම 10% කින් අඩු කිරීමේ ක්‍රියා පටිපාටිය අවලංගු කළ යුතුව ඇති අතර, බදු සඳහා සියළු ම දේපොළ වෙළෙඳ පොළේ පවත්නා ප්‍රමාණයනට අනුව අගය කළ යුතුව ඇත. මෙසේ කරන ලද්දේ ග්‍රාමීය දේ පළ බොහොමයකට ම ලහාවීමේ හැකියාව දූන් දියුණු වී ඇති හෙයිනි.

මෙම පියවරවල් හේතුකොට ගෙන ආදයම සම්බන්ධයෙන් ඇති වන ප්‍රතිඵලය විශේෂ වේ යැයි බලාපොරොත්තු නොවේ.

## (III) පිරිවැටුම් බදු

වර්ෂයකට රුපියල් 1,00,000 ට අඩු අගයක නිමැයුමක් ඇති ව්‍යාපාරත් මෙම බද්දෙන් මුළුමනින් ම නිදහස් කොට ඇති ද්‍රව්‍යයනුත්, දිගටම බද්දෙන් නිදහස් කර ගෙන යන අතරම, නිෂ්පාදනයෙහි නොයෙදෙන සියළු ම ව්‍යාපාර වලින් අය කැරුන ½% පොදු අනුපාතිකය 1% දක්වා ඉහළ නංවන ලදී.[2] කටු කම්බි හා තුනී ලැලි වලින් ද, වහල සෙවිලි කරන ඇස් බැස්ටොස් තහඩු හැර, අනෙකුත් ගොඩනැගිලි උපකරණ වලින් ද අය කැරුන 3% අනුපාතිකය එලෙසම පවත්වා ගෙන යන ලදී. අනෙකුත් සියළු ම නිෂ්පාදිත නිමවන අවස්ථාවේ දී 5% බද්දට යටත් කරන ලදී.[3] මෙම වෙනස් කම් වලින් රජයට ලැබෙන අමතර ආදයම රුපියල් දශ ලක්ෂ 30·0 ක් පමණ වේ යයි බලාපොරොත්තු වනු ලැබේ.

## (IV) රෙදිපිළි ආනයන පිළිබඳ බලපත්‍ර ගාස්තු

රෙදිපිළි වෙළෙඳාමේ එක ම ආනයනකරු සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව විය යුතු යැයි තීරණය කරන ලදී. මේ නිසා සියළු ම රෙදිපිළි ආනයනය වෙනුවෙන් 10% ක ආනයන බල පත්‍ර ගාස්තුවක් නියම කරන ලදී[4] මෙම ගාස්තුව සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් ලබා ගත යුතු වූ අතර, සලාක ක්‍රමය යටතේ පාරිභෝගිකයාට දෙන රෙදි වල මිල ඉහළ නොනැංවීමට සංස්ථාව වග බලා ගත යුතු විය. කෙළින් ම ප්‍රයෝජනයට ගන්නා අයට දුන් බල පත්‍ර යටතේ සුළු වශයෙන් ආනයනය කැරුන රෙදි ද, මෙම ගාස්තුවට යටත් කරන ලදී. මෙම පියවරින් බලාපොරොත්තු වන අතිරේක ආදයම රුපියල් දශ ලක්ෂ 10·0 කි.

---

(1) මුදල් බදු (සංශෝධන) පනත ඉදිරිපත් කර ඇත.
(2) 1966 ජූලි 29 වැනි දින හා අංක 14706/3 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රය.
(3) එයමයි.
(4) 1966 නොවැම්බර් 1 වැනි දින හා අංක 14719/5 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රය.

## (V) පිටි මිල වැඩි කිරීම

පිටි රාත්තලක මිල ශත 5 කින් වැඩි කරන ලදී. එසේ කරන ලද්දේ පිටි වෙනුවෙන් දරන සහනාධාරය ඉවත් කරන අදහසින් ය. මේ වන විට පිටි සහනාධාරය රුපියල් දශ ලක්ෂ 12·0 ක් වූ අතර, මෙසේ එය ඉහළ ගියේ තොග වෙළෙඳ පොළේ පිටි මිල ඉහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පියවර ගැනීම මැනවැයි යෝජනා කරන ලද්දේ ශුද්ධ ආහාර සහනාධාරය 1965/66 වර්ෂයේ තිබූ ප්‍රමාණයට සීමා කොට තබා ගැනීමටය. ශුද්ධ ආහාර සහනාධාරය සම්බන්ධයෙන් දරන වියදම් පියවා ගැනීම සඳහා මෙම පියවර ගැනීමෙන් බලාපොරොත්තු වූ අතිරේක ආදයම රුපියල් දශ ලක්ෂ 25·0 කි.

### වියදම

1966/67 වර්ෂය සඳහා අනුමත කැරුන වියදම රුපියල් දශ ලක්ෂ 2,843·7 කි, මේ මුළු වියදමින්, රුපියල් දශ ලක්ෂ 2,082·0 ක් ආවර්තන වියදම්[1] (1, 2, 4 හා 6 යන සම්මත වැය ශීර්ෂ) වන අතර, ප්‍රාග්ධන වියදම (සම්මත වැය ශීර්ෂ 3, 5 සහ 7) රුපියල් දශ ලක්ෂ 761·7 ක් වන්නේ ය. ආවර්තන වියදම් සම්බන්ධයෙන් 2½% ක ඌන වියදමක් ද, ප්‍රාග්ධන වැය ශීර්ෂ සඳහා 10% ඌන වියදමක් ද සඳහා සිරිත් පරිදි ඉඩ සැලසූ විට, මුළු සම්මත වියදම රුපියල් දශ ලක්ෂ 2,718·2 ක් වනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. මෙම ගණන 1965/66 නියම මුලු වියදම වන (තාවකාලික) රුපියල් දශ ලක්ෂ 2,483·0 ට වඩා රුපියල් දශ ලක්ෂ 235·2 කින් වැඩිය. එය ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 77·4 කින් හා ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 157·8 කින් ඉහළ යෑමක් පිළිබිඹු කරයි.

### වර්තන වියදම

මුළු ආවර්තන වියදම (වැය ශීර්ෂ 1, 2, 4 හා 6) රුපියල් දශ ලක්ෂ 2,082·0 කට තක්සේරු කර ඇත. මෙම මුදලින් ආවර්තන වියදම් යටතේ වන ප්‍රාග්ධන වැය ශීර්ෂ හා නිදන් අරමුදල් දයක දීමනා සඳහා සැලසූ ප්‍රමාණය අඩු කළ පසු ලැබෙන වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 1,891·8 කි. මෙය 1965/66 වර්ෂය තුළ කැරුණු නියම මුළු (තාවකාලික) වියදම වන රුපියල් දශ ලක්ෂ 1,792·0 හා සැසඳේ.

1966/67 වර්ෂයේ වර්තන වියදම් 1965/66 වර්ෂයේ නියම වියදම් (තාවකාලික) හා සසඳන කල, (රුපියල් දශ ලක්ෂ 99·8 කින්) ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආර්ථික සේවාවන් (රුපියල් දශ ලක්ෂ 22·4), ශුද්ධ ආහාර සහනාධාරය (රුපියල් දශ ලක්ෂ 17·3), අධ්‍යාපනය (රුපියල් දශ ලක්ෂ 15·8), රාජ්‍ය ණය පොළී (රුපියල් දශ ලක්ෂ 16·6), විශ්‍රාම වැටුප් (රුපියල් දශ ලක්ෂ 15·0) සහ පරිපාලනය (රුපියල් දශ ලක්ෂ 13·9) පිළිබඳ වූ වියදම වැඩිවීමය.

### ප්‍රාග්ධන වියදම

1966/67 ඇස්තමේන්තු වල සම්මත ප්‍රාග්ධන වැය ශීර්ෂ වන රුපියල් දශ ලක්ෂ 761·7 (මෙය මුළු සම්මත වැයෙන් 27% ක් පමණය.) කුමන වර්ෂයක් සඳහා හෝ වෙන් කළ ප්‍රමාණයට වඩා වැඩි වූ අතර, මෙය 1965/66 වර්ෂයේ මුල් ඇස්තමේන්තු වල වෙන් කිරීමටත් වඩා රුපියල් දශ ලක්ෂ 183·6 කින් හෙවත් 32% කින් වැඩිය. එසේම පසුගිය වර්ෂ තුන ඇතුළත ප්‍රාග්ධන කටයුතු සඳහා සම්මත වැය සම්බන්ධයෙන් වූ සියයට 23 ඌන වියදම් සාමාන්‍යය විවිධ බාධක ඉවත් කිරීමෙන් පසුව, 1966/67දී 10% ක් විය හැකිය. ප්‍රාග්ධන වැය සම්මත සම්බන්ධයෙන් 10% ඌන වියදමක් ගැන සිතුව ද, 1966/67 වර්ෂයේ ඇස්තමේන්තු වල සලසා

(1) නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් කැරුන රාජ්‍ය ණය අවක්‍ර ගෙවුම් ඇතුළත් වෙයි.

ඇති ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 685·5ක් වන්නේය. මෙය මෙතෙක් ඕනෑම වර්ෂයක් සඳහා සම්මත කැරුන ඉහළ ම වියදම ය. අතිරේක අය වැය අරමුදල් වලින් කැරෙන ප්‍රාග්ධන වියදම් හා ආවර්තන වියදම් වැය ශීර්ෂ යටතේ වන ප්‍රාග්ධන ශීර්ෂ එක්කොට ගත් කල, ඇස්තමේන්තු කළ මුළු ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 818·4 ක් වෙයි.[1] මෙය, 1965/66 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ වියදමට (රුපියල් දශ ලක්ෂ 668·0) වඩා රුපියල් දශ ලක්ෂ 150·4 ක වැඩි වීමක් ද, 1965/66 වර්ෂයේ (තාවකාලික) නියම වියදමට (රුපියල් දශ ලක්ෂ 632·4) වඩා රුපියල් දශ ලක්ෂ 186·0 ක වැඩි වීමක් ද නිරූපණය කරයි.

**අය වැය ලේඛනයෙන් යෝජිත අනෙකුත් විධිවිධාන**

**1. අය බදු කොමිසම**

1965/66 වර්ෂයේ අය වැය ලේඛනයේ දී කළ ප්‍රකාශය අනුව යමින්, වඩාත්, සම්පූර්ණ හා ඒකාබද්ධ බදු ක්‍රමයක් ඇති කිරීම පිණිස ආදයම් නිර්ණය හා බදු පෙළඹ වීම් වලට අදාළ ප්‍රතිපාදන පිළිබඳව පුළුල් විමර්ශනයක් පැවැත්වීම සඳහා බදු කොමිසමක් පත් කිරීමට රජය තීරණය කර ඇත.[2] මෙම කොමිසම විසින් බදු පෙළඹ වීම් ව්‍යුහය මුළුමනින් ම හදරා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. මෙම කොමිසම පත් කිරීමේ බලාපොරොත්තුවෙන් එම වර්ෂයේ අය වැය ලේඛනයෙන් ආදයම් බදු ව්‍යුහයේ කිසි වෙනසක් කිරීමට තමා, යෝජනා නො කරන බව මුදල් ඇමති තුමා ප්‍රකාශ කළේ ය.

**2. තීරු බදු ප්‍රතිශෝධනය**

තීරු බදු ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් අය වැය ලේඛනයේ ප්‍රකාශ කෙරුණු ප්‍රතිශෝධන මූලික ස්වරූපයක් ගත් ඒවා විය. ඊට හේතු වූයේ රජය විසින් පිහිටු වන ලද තීරු බදු උපදේශක මණ්ඩලයේ උපදෙස් අනුව තීරු බදු ක්‍රමය පුළුල් පරීක්ෂණයකට භාජනය කිරීමේ බලාපොරොත්තුව යි.

**3. විදේශීය ආයෝජන**

විදේශීය ආයෝජන දිරි ගැන්වීමේ අදහස මුල් කර ගෙන විදේශීය ආයෝජන පිළිබඳව සිය ප්‍රතිපත්ති පැහැදිළි කරමින් 1966 මාර්තු මාසයේ දී රජය විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. නව ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග පහත දක්වේ :—

(අ) ආයෝජනයක් අනුමත කිරීමෙන් පසු, එහි ලාභ, ලාභාංශ හා පොළී ප්‍රේෂණයට ද, ප්‍රාග්ධනය සිය රට යැවීමට ද ඉඩ දෙනු ලැබේ.

(ආ) විදේශීය කළමනාකාර වරුන් හා ශිල්පීන් මෙරටට කැඳවීමට ද, එසේ සේවාවේ යොදවන විදේශිකයන්ගේ පවුල් නඩත්තුවට කැරෙන ප්‍රේෂණයන වද, ඉඩ දෙනු ලැබේ.

(ඇ) සේවයේ යෙදෙන විදේශික නිලධරයන් විශ්‍රාම ගන්නා විට ඔවුන්ගේ ඉතිරි කිරීම් පිට රට යැවිය හැකිය.

---

(1) සම්මත ප්‍රාග්ධන වලින් අය කර ගත හැකි වියදම් වලින් 10... ක ඌන වියදමකට ඉඩ හැරීමෙන් පසු.

(2) බදු පරීක්ෂණ කොමිසමක් දැන් පත් කොට ඇත.

(ඈ) සාධාරණ පුරස්කාර ගෙවීම්, ශිල්පීමය සේවා ගාස්තු ආදියට ද, ඉඩ දෙනු ලැබේ.

(ඉ) අයිතිය පැහැර ගැනීමෙන් හා අසාධාරණ සැලකිලි වලට භාජනය කිරීමෙන් විදේශීය ආයෝජකයන් ආරක්ෂා කරනු ලැබේ.

විදේශීය ආයෝජන පිළිබඳ මෙම නව ප්‍රතිපත්තිය අනුව, ලංකාවේ විදේශීය ආයෝජන වර්ධනය කිරීම සඳහා වර්ෂය තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදය සමග ආයෝජන සහතික වැඩ පිළිවෙළක් පිළිබඳ ගිවිසුමක් අත්සන් කරන අතර, ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව සමග තවත් ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය.

**4. ලාභාංශාදිය පිටරට යැවීම අත්හිටවීම ලිහිල් කිරීම**

ලාභාංශාදිය පිටරට යැවීම අත් හිටවීම යටතේ රඳවා ගෙන තිබෙන අරමුදල්, ගෙවීම් සීමා වන් හි වෙනස්වීම් වලට යටත් ව, 1966 මුල් පස් මස තුළ මසකට රුපියල් දශ ලක්ෂ 1·0 බැගින් ද, ඉතිරි හත් මස තුළ මසකට රුපියල් දශ ලක්ෂ 3·5 බැගින් ද මුදලීමට තමා අදහස් කොට ඇති බව මුදල් ඇමති තුමා ප්‍රකාශ කළේය. මේ ක්‍රමය අනුව, 1966 සඳහා මුදලීම රුපියල් දශ ලක්ෂ 29·5 ක් වේ. 1965 දී මේ අයුරින් දෙනු ලැබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6·0 ක් විය. ධන සම්පත් තත්ත්වය යහපත් වෙත් ම, ලාභාංශාදිය පිටරට යැවීම අත්හිටවීමේ පිළිවෙත සම්පූර්ණ යෙන් ම ඉවත් කිරීම පිණිස ක්‍රියා කිරීමේ සිය ප්‍රතිපත්තිය ද රජය විසින් ප්‍රකාශ කරන ලදී.

**5. දේශ සංචාරණය**

දේශ සංචාරණයෙන් සැහෙන විදේශීය විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට රජය බලා පොරොත්තු වෙයි. මෙය අරමුණු කොට ගෙන දනට තිබෙන දේශ සංචාරක කාර්යාංශය වෙනුවට දේශ සංචාරක කටයුතු ප්‍රතිසංවිධානය කිරීම සඳහා දේශ සංචාරක මණ්ඩලයක් පිහිටුවා තිබේ. දේශ සංචාරකයන් සඳහා සුදුසු භෝජනාගාර ඉදි කිරීමට භෝජනාගාර සංස්ථාවක් පිහිටු වීම පිණිස පනතක් ද සම්මත කොට ඇත.

**6. රෙදිපිළි ආනයන**

සමූපකාර තොග වෙළෙඳ සංගමය එකම රෙදිපිළි ආනයනකරු වශයෙන් පත් කිරීමට ද, එසේ ආනයනය කැරෙන සියළු ම රෙදිපිළි මිල පාලනයට යටත් කිරීමට ද රජය විසින් තීරණය කොට ඇත.

**7. ණය දීමේ හා ඉතිරි කිරීමේ ආයතන ප්‍රතිසංවිධානය**

(අ) පසුගිය වර්ෂයේ අය වැය ලේඛනයෙන් පමුණුවන ලද පරිදි විදේශීය බැංකු වලට රටේ ආර්ථික සංවර්ධනයෙහි ලා වඩාත් වැඩදයි ක්‍රියා මාර්ගයන් අනුගමනය කළ හැකි වන පරිදි, 1961 මුදල් පනතින් එම බැංකු කෙරෙහි පනවා ඇති සීමා කිරීම් අවලංගු කිරීමට රජය අදහස් කරයි.

(ආ) මහජන බැංකු කොමිසමේ නිර්දේශයන් සැලකිල්ලට ගෙන මහජන බැංකු පනත සංශෝධනය කිරීමට ද රජය අදහස් කර ඇත. මහජන බැංකුවේ, ණය බේරුම් ක්‍රමය බැංකුවට දැඩි බරක් වන හෙයින්, එය බැංකුවෙන් ඉවත් කොට එම කාර්යය සඳහා වඩාත් සුදුසු වෙනත් සංවිධානයකට පැවරිය යුතු යැයි කිය වෙන මහජන බැංකු කොමිසමේ නිර්දේශය දනටමත් රජයේ සැලකිල්ලට භාජනය වී ඇත.

(ඇ) පසුගිය වර්ෂයේ අය වැය ලේඛනයෙන් කරන ලද ප්‍රකාශනයට අනුව, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව හා ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරය ඒකාබද්ධ කොට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවක් පිහිටුවීම පිණිස ලඟදී ම නීති සම්පාදනය කිරීමට රජය අදහස් කරයි.

(ඈ) ලංකා බැංකුව රාජ්‍ය ආයතනයක් වශයෙන් දැනට තිබෙන තත්ත්වයට අනුරූප වන පරිදි හා ආර්ථික සංවර්ධනය සඳහා මුදල් යෙදවීමෙහි ලා වඩාත් පුළුල් ක්‍රියාකාරිත්වයක් එයට දීම සඳහා 1938 ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීම සඳහා පනතක් දැනට සකස් වෙමින් පවතී.